# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,897 — 1970 මාර්තු 13 වැනි සිකුරාද— 1970.3.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 231 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 238 | අය-වැය ලේඛන ... ... ... | 244 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 243 | මාර්ග කොමිටි දන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම් ... | 243 | විවිධ දන්වීම් ... ... ... ... | 249 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී—බී. 3/60

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළි කඩවත්සතර ගම්සභාව

#### වීථි සම්මාදම් එකතු කිරීම විධිමත් කිරීමේ ආඥාපනත

1958 අංක 38 දරණ පනතින් සංශෝධිත (478 වන අධිකාරය වන) වීථි සම්මාදම් එකතු කිරීම විධිමත් කිරීමේ ආඥාපනතේ 2 වෙනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඩවත්සතර ගම් ප්‍රදේශය සම්බන්ධයෙන් පනවනු ලැබ එකී වගන්තිය යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝග.

ආර්. ප්‍රේමදස,
පළාත් පාලන ඇමති.

1970 පෙබරවාරි 27,
කොළඹ දිය.

#### නියෝග

1. මේ නියෝග ''1968 නුවරඑළිය කඩවත් සතර ගම් සභාවේ වීථි සම්මාදම් එකතු කිරීම පිළිබඳ නියෝග'' වශයෙන් හැඳින්විය හැකිය.
2. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් හැර—

''සභාපති'' යනුවෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඩවත් සතර ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සභාපති අදහස් කෙරේ.

''පුණ්‍ය කටයුත්ත'' යනුවෙන් පවත්වනු ලබන සම්මාදමක හෝ භාණ්ඩ විකිණීමක ප්‍රයෝජන යොදවන පුණ්‍ය ආයතනය හෝ පුණ්‍ය කටයුත්ත අදහස් කෙරේ.

''එකතු කිරීම'' යනුවෙන් යම්කිසි පුණ්‍ය කටයුත්තක් හෝ වෙනත් එවැනි සමාන කාර්යයක් සඳහා මුදල් එකතු කිරීම අදහස් කෙරේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

''එකතු කරන්නා'' යනුවෙන් ඒ මුදල් එකතු කිරීමේ කටයුතු සඳහා මහජනයාගෙන් මුදල් ලබා ගැනීමෙන් කරන කිසියම් මුදල් එකතු කිරීමකට සහභාගි වන තැනැත්තෙක් අදහස් කෙරේ.

''අරමුදල'' යනුවෙන් යම් පුණ්‍ය හෝ පරාර්ථකාමී කාර්යයක් සඳහා වෙන් කර තිබෙන හෝ වෙන් කළ යුතු හා සම්මාදම් මුදල් එකතු කිරීමක් හෝ භාණ්ඩ වෙළඳාමක් පැවැත්වීමෙන් ලැබෙන අරමුදල අදහස් කෙරේ.

''වෙළඳාම'' යනුවෙන් යම් පුණ්‍ය කටයුත්තක් හෝ ඒ හා සමාන වෙනත් කාර්යයක් සඳහා පවත්වනු ලබන භාණ්ඩ විකිණීමක් අදහස් කෙරේ.

''ඇවිද විකුණන්නා'' යනුවෙන්, ඒ වෙළඳාම සඳහා සපයා ඇති භාණ්ඩය හෝ භාණ්ඩ මහජනයා වෙත ගෙන ගොස් විකිණීමෙන් යම් වෙළඳාමකට සහභාගි වන තැනැත්තෙක් අදහස් කෙරේ.

''ගම් ප්‍රදේශය'' යනුවෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඩවත් සතර ගම් ප්‍රදේශය අදහස් කෙරේ.

3. කිසිවකු විසින්—

(අ) තමා යම් සමිතියක හෝ සංගමයක හෝ යම් පුණ්‍ය කටයුත්තක හෝ අරමුදලක පාලක මණ්ඩලයක සාමාජිකයකු නම් මිස, සහ

(ආ) ඒ මුදල් එකතු කිරීම පිණිස හෝ භාණ්ඩ විකිණීම පිණිස බලය දෙන අවසර පත්‍රයක් ඒ සමිතිය, සංගමය හෝ පාලක මණ්ඩලය විසින් මෙහි මින් මතු නියම කරනු ලබන අන්දමට සභාපතිගෙන් ලබා ගෙන තිබේ නම් මිස,

ගම් ප්‍රදේශය ඇතුළත යම් වීථියක හෝ පොදු ස්ථානයක යම් සම්මාදම් මුදල් එකතු කිරීමක් හෝ භාණ්ඩ විකිණීමක් සංවිධානය කිරීම හෝ ආරම්භ කිරීම නොකළ යුතුය.

එසේ වුවද, මේ නියෝගවල පෙරාතුව වූ විධිවිධානවල කිසිවක්—

(i) එළිමහන් රැස්වීමකදී කරනු ලබන යම් සම්මාදම් එකතු කිරීමක් ; හෝ

(ii) සාමාන්‍ය වෙළඳ ක්‍රමය අනුව හෝ ජීවිකාව කරගෙන යාමේ කාර්ය සඳහා ඒ වෙළඳාමෙන් ලැබෙන මුදලෙන් යම් කොටසක් යම් පුණ්‍ය කටයුත්තක් සඳහා යොදවන බවට වෙළඳාම් කරන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් කරුණු ඉදිරිපත් නොකර යම් භාණ්ඩයක් යම් වීථියක හෝ ප්‍රසිද්ධ ස්ථානයක විකිණීම ;

තහනම් හෝ කිසිදු අයුරකින් අවහිර කරන සේ නො සැලකිය යුතුය.

4. මේ නියෝග යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන සමිතියක, සංගමයක හෝ යම් පුණ්‍ය කටයුත්තක් හෝ අරමුදලක පාලක මණ්ඩලයක සාමාජිකයකු වන කිසිම තැනැත්තකු විසින් ඒ අවසර පත්‍රයේ කොන්දේසිවලට අනුකූල නොවන වෙනත් යම් අන්දමකට සම්මාදම් මුදල් එකතු කිරීමට හෝ ඒ සඳහා භාණ්ඩ විකිණීම පවත්වා ගෙන යාමට සැලැස්වීම හෝ අවසර දීම නො කළ යුතුය.

5. අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම—

(අ) මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ''අ'' ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ යුතුය ;

(ආ) අවසර පත්‍රය අවශ්‍ය සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම සංවිධානය කරන සමිතියේ, සංගමයේ හෝ පුණ්‍ය කටයුත්තේ හෝ මුදලේ පාලක මණ්ඩලයේ එක් සාමාජිකයකු විසින් හෝ වැඩි දෙනකු විසින් අත්සන් කළ යුතුය ;

(ඇ) සභාපති නමට යැවිය යුතුය ; තවද

(ඈ) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම පැවැත්වීමට නියමිත මාසයකට කලින් මාසේ පළමුවැනි දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය ;

එසේ වුවද යම් ඉල්ලුම් පත්‍රයක් යථෝක්ත දිනට පසුව ඉදිරිපත් කරනු ලැබුවද ඒ ගැන නොසලකා යම් කරුණක් සම්බන්ධයෙන් ඒ විශේෂ හේතූන් පිට සභාපති විසින් ඒ ඉල්ලුම් පත්‍රය භාර ගැනීම කළ හැකිය.

6. සභාපති විසින් නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුය:—

(1) අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් දිනයේදී හා කාලවේලා අතර සහ වීථිවල හෝ ස්ථානවල සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම කළ යුතු ය.

(2) වයස අවුරුදු දහහතරෙන් අඩු කිසිම අයෙකුට සම්මාදම් මුදල් එකතු කරන්නෙකු වශයෙන් හෝ ඇවිද භාණ්ඩ විකුණනන්නකු වශයෙන් ක්‍රියා කිරීමට බලය හෝ අවසරය නො දිය යුතුය.

(3) සම්මාදම් මුදල් එකතු කරන්නකු වශයෙන් හෝ ඇවිද භාණ්ඩ විකුණන්නකු වශයෙන් ක්‍රියා කිරීමට බලය පවරනු ලැබූ සෑම කෙනෙකුටම සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම ආරම්භ කිරීම සඳහා නියමිත කාල වේලාවට කලින් සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ ලේකම්ගේ හෝ වෙනත් සාමාජිකයෙකුගේ අත්සන සහිත ලිඛිත බලපත්‍රයක් දිය යුතුය.

(4) එකතු කරනු ලබන සම්මාදම් මුදල් හෝ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් දමන සියලුම පෙට්ටිවල හෝ වෙනත් භාජනවල අනුක්‍රමයෙන් අංක යෙදිය යුතුවත් හැර, මුද්‍රා නොකඩා ඒවා තුළ දමා ඇති මුදල් ගැනීමට නොහැකි වන පරිදි ඒ පෙට්ටි හා භාජන සුරක්ෂිත ලෙස වසා මුද්‍රා තැබිය යුතුය. තවද සම්මාදම් මුදල් එකතු කරන්නකු හෝ ඇවිද භාණ්ඩ විකුණන්නකු වශයෙන් ක්‍රියා කිරීමට බලය පවරා ඇති එක් එක් තැනැත්තාට දෙන එක් එක් පෙට්ටියේ හෝ භාජනයේ අනුක්‍රමික අංක පිළිබඳ සටහනක් ද තබා ගත යුතු ය.

(5) ඒ සෑම පෙට්ටියක ම හෝ භාජනයකම—

(අ) පුණ්‍ය කටයුත්තක් හෝ පුණ්‍ය අරමුදලේ නම හෝ සම්මාදම් මුදල් එකතු කරනු ලබන්නේ හෝ භාණ්ඩ විකිණීම පවත්වනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය ;

(ආ) සම්මාදම් එකතු කිරීමේ හෝ භාණ්ඩ විකිණීමේ දිනය සහ ;

(ඇ) සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක සභාව විසින් ඒ ඒ පෙට්ටිය සඳහා හෝ භාජනය සඳහා නියම කර තිබෙන අනුක්‍රමික අංකය ද කාටත් හොඳින් පෙනෙන තැනක සටහන් කර තිබිය යුතුය.

(6) (අ) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් ස්වකීය සේවය සඳහා සම්මාදම් මුදල් එකතු කරන හෝ භාණ්ඩ විකුණන හෝ කිසිම අයෙකුට හෝ ;

(ආ) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම ආරම්භ කිරීම හෝ පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් නියම වශයෙන් හෝ අනියම් වශයෙන් වෙනත් කිසිම අයෙකුට, ඒ තැනැත්තාගේ නම් සහ ගෙවීම් හෝ පාරිතෝෂික දීමනාවේ ස්වභාවය ද, අවසර පත්‍රය සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර තිබේ නම්, මිස කිසිම ගෙවීමක් නොකළ යුතුවාත් හැර යම් පාරිතෝෂික දීමනාවක් නොදිය යුතුය.

7. කිසිවකු විසින්—

(අ) තමා වයස අවුරුදු දහහතරකට අඩු වන්නේ නම්; හෝ

(ආ) තමා සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් ඒ බලය දීමට බලය පවරනු ලැබූ ලේකම්ගේ හෝ වෙනත් සාමාජිකයෙකුගේ ලිඛිත බලයක් නොදරන්නකු නම් ; හෝ

(ඇ) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම සඳහා සභාපති විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකින් බලය දී නැති බව තමා දන්නේ නම් හෝ ඒ බව තමාට විශ්වාස කළ හැකි අන්දමට හේතු තිබේ නම්, කිසිම සම්මාදම් මුදල් එකතු කිරීමක් හෝ ඒ සඳහා භාණ්ඩ විකිණීමක් හෝ සම්බන්ධයෙන් සම්මාදම් මුදල් එකතු කරන්නකු හෝ ඇවිද භාණ්ඩ විකුණන්නකු වශයෙන් ක්‍රියා නොකළ යුතුය.

8. සම්මාදම් මුදලක් එකතු කරන්නකු වශයෙන් හෝ ඇවිද භාණ්ඩ විකුණන්නකු වශයෙන් ක්‍රියා කරනු ලබන කිසිම තැනැත්තකු විසින්—

(අ) සුරක්ෂිතව වසා මුද්‍රා තබා නැත්තාවූ ද,

(i) එහි පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ නම නැතහොත් සම්මාදම් එකතු කරන භාණ්ඩ විකිණීම පවත්වනු ලබන කාර්යය ;

(ii) සම්මාදම් මුදල් එකතු කිරීමේ හෝ භාණ්ඩ විකිණීමේ දිනය ; සහ

(iii) සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් ඒ පෙට්ටියට හෝ භාජනයට නියමකර ඇති අනුක්‍රමික අංකය ද කාටත් හොඳින් පෙනෙන තැනක සටහන් කර නැත්තාවූ ද, සම්මාදම් මුදල් එකතු කරන යම් පෙට්ටියක් හෝ භාජනයක් ගෙන යෑම හෝ පාවිච්චි කිරීම හෝ ;

(ආ) ඒ සඳහා නිකුත් කරන අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් නොකරන ලද වෙන යම් දිනයක, හෝ කාලවේලාවක, හෝ යම් වීථියක හෝ ස්ථානයක සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම කර ගෙන යෑම ; හෝ

(ඇ) යම් වීථියක රථවාහන ගමනාගමන මාර්ගයේ යම් කොටසක හෝ වීථියක පාගමනින් යන යම් කොටසක යම් අන්දමකින් හෝ යම් වීථියක හෝ පොදු ස්ථානයක හෝ ඒ වීථිය හෝ පොදු ස්ථානය නීත්‍යානුකූලව පාවිච්චි කරනු ලබන අයකුට යම් අවහිරයක් හෝ කරදරයක් සිදුවන අන්දමින් හෝ සම්මාදම් මුදලක් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම කරගෙන යාම ; හෝ

(ඈ) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම හෝ සඳහා දිගින් අඟල් තිහකට හෝ පළලින් අඟල් විස්සකට හෝ වැඩි වූ යම් මේසයක් පාවිච්චි කිරීම හෝ මහජනයාට අවහිර වන්නාවූ හෝ අවහිර විය හැකි වූ අන්දමකට යම් මේසයක් පාවිච්චි කිරීම ; හෝ

(ඉ) තමා සම්මාදම් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම පවත්වාගෙන යනු ලබන්නාවූ ස්ථානයේ තමා ළඟ යම් සතෙකු තබා ගැනීම ; හෝ

(ඊ) සම්මාදම් මුදල් එකතු කිරීමෙහිලා හෝ භාණ්ඩ විකිණීමෙහිලා යම් තැනැත්තකුගේ කරදරයකට හේතුවන පරිදි ඔහුට කන්නලවු කිරීම ; හෝ

(උ) සම්මාදම් එකතු කිරීමෙන් හෝ භාණ්ඩ විකිණීමෙන් ලබන යම් මුදලක් ඒ සඳහා තමාට දෙන ලද මුද්‍රා තැබූ පෙට්ටියේ හෝ භාජනයේ හෝ පෙට්ටිවලින් හෝ භාජනවලින් හෝ එකක නොදැමීම ; හෝ

(ඌ) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම අවසාන කරනු ලැබීමෙන් පසුව, ඒ සඳහා තමාට දෙන ලද එක් එක් පෙට්ටියේ හෝ භාජනයේ මුද්‍රා නොකැඩෙන සේ ප්‍රවේසමින්, ඒ පෙට්ටි හෝ භාජන භාර ගැනීමට සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් බලය දී ඇති අයට මොනම හේතුවක් නිසාවත් ඒවා භාර නොදීම හෝ භාරදීම ප්‍රතික්ෂෙප කිරීම, නොකළ යුතුය.

9. සම්මාදම් මුදල් එකතු කරන්නකු වශයෙන් හෝ ඇවිද භාණ්ඩ විකුණන්නකු වශයෙන් ක්‍රියා කරන සෑම තැනැත්තකු විසින්ම සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් තමා වෙත නිකුත් කොට තිබෙන ලිඛිත බලය පරීක්ෂා කර බැලීම සඳහා යම් පොලිස් නිලධරයකු විසින් ඉල්ලා සිටි විට එය ඔහු වෙත වහාම ඉදිරිපත් කළ යුතු ය.

10. (1) යම් සම්මාදම් මුදලක් එකතු කිරීමේ හෝ භාණ්ඩ විකිණීමේ හෝ දිනයෙන් පසුව මාසයක් ඇතුළත දී සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින්—

(අ) සම්මාදම් එකතු කිරීමෙන් හෝ භාණ්ඩ විකිණීමෙන් ලැබුණු මුදල් හා ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් පිළිබඳව ප්‍රකාශයක් මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ''ආ'' ආකෘතියට සාරානුකූලව පිළියෙල කිරීමටත්, සමිතිය සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධරයන් දෙදෙනකු විසින් එහි අත්සන් කිරීමටත් සැලැස්විය යුතුය ;

(ආ) සමිතිය, සංගමය හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් පත් කරන ලද ගණන් පරීක්ෂකයකු ලවා හෝ එබඳු ගණන් පරීක්ෂකයකු නොමැති අවස්ථාවක, සමිතියේ, සංගමයේ හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයකු නොවන වගකිව යුතු තැනැත්තකු ලවා ඒ ප්‍රකාශය පරීක්ෂා කරවිය යුතුය ; තවද

(ඇ) එසේ පරීක්ෂා කරන ලද මුල් ප්‍රකාශය එහි දැක්වෙන වියදම් පිළිබඳ විෂයයන් සම්බන්ධ සාක්ෂි වශයෙන් කුවිතාන්සි හෝ වවුචර ද සමග, සභාපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) සම්මාදම් මුදල් එකතු කිරීමක් හෝ භාණ්ඩ විකිණීමක් පිළිබඳ වියදම් එකතු කරන ලද මුදලින් හෝ භාණ්ඩ විකිණීමෙන් ලබා ගත් මුදලින් විශේෂ වූ යම් ආධාර මුදල් වලින් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් ගෙවනු ලබන යම් අවස්ථාවක එබඳු ආධාර මුදල් ඒ ප්‍රකාශනයේ ''අය'' යන ශීර්ෂය යටතේ ද ''වැය'' යන ශීර්ෂය යටතේ ද යන මේ උභය ශීර්ෂයන් යටතේම ඇතුළත් කළ යුතු ය.

11. සමිතිය, සංගමය, හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් එසේ කිරීමට සභාපති විසින් නියමකරනු ලබන්නේ නම් සම්මාදම් මුදල එකතු කිරීමෙන් හෝ භාණ්ඩ විකිණීමෙන් ලබාගත් මුදල්, පුණ්‍ය කටයුත්තක හෝ අරමුදල සඳහා හෝ සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම කරන ලද්දේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා නිසි ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් සාක්ෂි සභාපතිට ඒත්තු යන පරිදි ඉදිරිපත් කළ යුතු ය.

## උප ලේඛනය

### '' අ '' ආකෘති පත්‍රය

### අවසර ඉල්ලුම් පත්‍රය

(1) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම හෝ පිළිබඳ වගකිව යුතු සමිතියේ,සංගමයේ හෝ පුද්ගල මණ්ඩලයේ නම :————.

(2) ලිපිනය :————.

(3) සමිතියේ, සංගමයේ හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලයේ නිලධාරින්ගේ හෝ සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම පිළිබඳව සාමූහික වශයෙන් වගකිව යුතු අවසර පත්‍රය ඉල්ලුම් කරන්නවුන්ගේ නම හා ලිපින :————.

(4) ආධාර ලැබිය යුතු පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ නම :————.

(5) පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පරිපාලක මධ්‍යස්ථානයේ ලිපිනය සහ එහි ලේකම්ගේ නම හා ලිපිනය :————.

(6) පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පරමාර්ථ :————.

(7) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම පැවැත්වීමට බලාපොරොත්තු වන දිනය :————.

(8) සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම බලාපොරොත්තු වන ප්‍රදේශය :————.

(9) සම්මාදම් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් සම්මත කර ගනු ලබන ක්‍රියා මාර්ගය :————.

(10) සම්මාදම් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම හෝ ආරම්භ කිරීමට හෝ පැවැත්වීමට සම්බන්ධ තැනැත්තන්ට (යම් මුදලක් ගෙවිය යුතු නම්) ඒ මුදල :————.

ඒ තැනැත්තන්ගේ නම හා ලිපින ද, එක් එක් තැනැත්තාට ගෙවිය යුතු මුදල ද සඳහන් කරන්න :————.

(11) ලැබෙන මුදල් පිළිබඳ ක්‍රියා කිරීම: ලැබෙන මුදල් සියල්ලම පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ ප්‍රයෝජනය පිණිස යෙදවීමට අදහස් කරනු ලැබේද? නැතහොත්, වෙනත් කාර්යයක වියදම් සඳහා යම් ගණනක් අඩු කරනු ලැබේද ? යම් මුදලක් අඩු කළ යුතු නම් කවර කාර්යයක් සඳහා ද යන්න සඳහන් කොට අඩු කරනු ලබන මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් ද ඉදිරිපත් කරන්න :————.

(12) මේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන තැනැත්තන්ගේ අත්සන් :————.

(13) ඉල්ලුම් පත්‍රයේ දිනය :————.

කඩවත් සතර ගම්සභාවේ සභාපති වෙත,

නානුඹය,

"අ" ආකෘති පත්‍රය

## අය-වැය පිළිබඳ ප්‍රකාශයයි

(1) බැංකු ගිණුමක් නොමැති විට සම්මාදම් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම පිළිබඳ වගකිව යුතු සමිතියේ, සංගමයේ හෝ පුද්ගල මණ්ඩලයේ නම :—
ආධාර ලැබිය යුතු පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ නම :————.
සම්මාදම් මුදල් එකතු කිරීමේ හෝ භාණ්ඩ විකිණීමේ දිනය :————.

අය වැය පිළිබඳ ප්‍රකාශය

| අය | මුදල රු. ශ. | එකතුව රු. ශ. | වැය | මුදල රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|---|---|
| සම්මාදම් මුදල් එකතු කරන්නවුන් (හෝ ඇවිද විකුණන්නවුන්) හා ගණන් පිළිබඳව මීට යාකොට ඇති ලැයිස්තුවේ පරිදි වීපී සම්මාදම් වලින් (හෝ භාණ්ඩ විකිණීමෙන්) | | | මුද්‍රණ ගාස්තු, තැපැල් ගාස්තු, දන්වීම් ගාස්තු, වීපී සම්මාදම් පෙට්ටි හා කරත්ත, පදක්කම් වෙනත් ලාංඡන (තිබේ නම්) වෙනත් දේ ඉතිරි මුදල් යෙදවීම (විස්තර සටහන් කරන්න) | | |
| මීට යාකොට ඇති වෙනත් මාර්ග වලින් | | | | | |
| ලැයිස්තුවේ පරිදි පරිත්‍යාග වලින් | | | | | |
| බැංකු පොලියෙන් | | | | | |
| වෙනත් දේ වලින් | | | | | |
| එනම් | | | | | |

ඉහත කී සමිතිය, සංගමය හෝ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ නිලධාරීන් වශයෙන් මෙහි පහත අත්සන් කරන අපි, යථෝක්ත අය-වැය ප්‍රකාශනය සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමු.

(1) නම සහ අත්සන :————.
නිල ස්වභාවය :————.
ලිපිනය :————.

(2) නම සහ අත්සන :————.
නිල ස්වභාවය :————.
ලිපිනය :————.
ගණන් පරීක්ෂකගේ හෝ සමිතියේ හෝ සංගමයේ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ හෝ පාලන මණ්ඩලයේ සාමාජිකයකු නොවන වෙනත් වගකිය යුතු තැනැත්තකුගේ සහතිකය :————.

ඉහත සඳහන් අය වැය ප්‍රකාශය මා විසින් යථා පරිදි පරීක්ෂා කරන ලදුව, ඒ නිවැරදි බව පිළිගන්නට යෙදුන බවත් ඊට අදල සියලුම වවුචර හා කුවිතාන්සි මා විසින් සුපරීක්ෂාකාරී ලෙස සොයා බලන ලද බවත් මම මෙයින් සහතික කරමි.
නම සහ අත්සන :————.
සුදුසුකම, වෘත්තීය හෝ රක්ෂාව :————.
ලිපිනය :————.
දිනය :————.

(ii) බැංකු ගිණුමක් තිබෙන විට එකතු කරන සියලුම සම්මාදම් මුදල් වහාම බැංකුවේ තැන්පත් කළ යුතු අතර සියලුම වියදම් චෙක්පත් වලින් ගෙවිය යුතුය. සම්මාදම් මුදල් එකතු කිරීම හෝ භාණ්ඩ විකිණීම පිළිබඳව වගකිවයුතු සමිතියේ සංගමයේ හෝ පුද්ගල මණ්ඩලයේ නම :————.
ආධාර ලැබිය යුතු පුණ්‍ය කටයුත්තේ අරමුදලේ නම :————.
සම්මාදම් මුදල් එකතු කිරීමේ හෝ භාණ්ඩ විකිණීමේ දිනය :————.

අය-වැය පිළිබඳ ප්‍රකාශය

| අය | මුදල රු. ශ. | එකතුව රු. ශ. | වැය | මුදල රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|---|---|
| සම්මාදම් මුදල් එකතු කරන්නවුන් (හෝ භාණ්ඩ විකුණන්නවුන්) හා ගණන් පිළිබඳව මීට යාකොට ඇති ලැයිස්තුවේ පරිදි වීපී සම්මාදම්වලින් (හෝ භාණ්ඩ විකිණීමෙන්) ... ... | | | බැංකු කුවිතාන්සිවලින් ... ... | | |
| වෙනත් මාර්ග වලින් ... ... | | | | | |
| මීට යාකොට ඇති ලැයිස්තුවේ පරිදි පරිත්‍යාග වලින් | | | | | |
| වෙනත් දේවලින් ... ... | | | | | |
| එනම් ... ... ... | | | | | |

බැංකු ගණන් හිලව්

| අය | | මුදල රු. ශ. | එකතුව රු. ශ. | වැය | මුදල රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|---|---|---|
| මුදල් කුවිතාන්සිවලින් ... | | | | මුද්‍රණ ගාස්තු හා ලිපි ද්‍රව්‍ය ... ... | | |
| | | | | තැපැල් ගාස්තු ... ... | | |
| | | | | දන්වීම් ගාස්තු ... ... | | |
| | | | | වීපී සම්මාදම් පෙට්ටි හා වාහන ... ... | | |
| | | | | පදක්කම් හෝ වෙනත් සලකුණු (තිබේ නම්) වෙනත් දේ ... ... ... | | |
| | | | | ඉතිරි මුදල් වැය කිරීම (විස්තර සඳහන් කරන්න) ... | | |

ඉහත සඳහන් සමිතිය, සංගමය, හෝ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධාරීන් වශයෙන් මෙහි පහත අත්සන් කරන අපි, යථෝක්ත අය–වැය ප්‍රකාශය සත්‍ය බවද නිවැරදි බවද මෙයින් සහතික කරමි.

(1) නම සහ අත්සන :————.
නිල ස්වභාවය :————.
ලිපිනය :————.

(2) නම සහ අත්සන :————.

නිල ස්වභාවය :————.

ලිපිනය :————.

(3) ගණන් පරීක්ෂකගේ හෝ සමිතියේ, සංගමයේ හෝ පුණ්‍ය කටයුත්තේ හෝ අරමුදලේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන වෙනත් වගකිය යුතු තැනැත්තකුගේ සහතිකය :————.

ඉහත සඳහන් අයවැය ප්‍රකාශය මා විසින් යථා පරිදි පරීක්ෂා කරන ලදුව, එය නිවැරදි බව පිළිගන්නට යෙදුන බවත්, ඊට අදළ සියලුම වවුචර හා කුවිතාන්සි මා විසින් සුපරීක්ෂාකාරී ලෙස සොයා බලන ලද බවත් මම මෙයින් සහතික කරමි.

නම සහ අත්සන :————.

සුදුසුකම, වෘත්තිය හෝ රක්ෂාව :————.

ලිපිනය :————.

දිනය :————.

3–223—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 60/53. පපාඅ/ආ 2/263.

## ගෙවල් කුලී සීමා කිරීමේ පනත

(274 වැනි අධිකාරය වන) ගෙවල් කුලී සීමා කිරීමේ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති රණසිංහ ප්‍රේමදාස වන මම මෙම නිවේදනයෙන්—

(අ) ගලහිටියාව ගම් සභාවේ සීමාවන් ඇතුළත වූ ප්‍රදේශය ඉහත කී පනත ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරමි, තවද,

(ආ) මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දිනය මේ නිවේදනය වලංගු විය යුතු දිනය ලෙස නියම කරමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ දීය.

3–240—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 69/41.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් මා කෙරෙහි පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති රණසිංහ ප්‍රේමදාස වන මම, කළුතර දිස්ත්‍රික්කයේ ඉත්තපාන ගම්ප්‍රදේශයේ ගම්සභාවට ඒ ගම්ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පණවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970 පෙබරවාරි මස 27 දින,
කොළඹදීය.

3–221—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 74/39

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් ආලන ඇමති.

1970 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

1968 ජූනි 14 වැනි දින අංක. 14,806 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩ විල්ලි හත්පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වැඩ ගම් ප්‍රදේශය වෙනස් කිරීමට එහි මායිම් නැවත විස්තර කිරීමට සහ හේවාවිස්ස ගම් ප්‍රදේශය සංස්ථාපනය කිරීමට අදාළ ආඥාවල සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මීට යා කොට ඇති උප ලේඛනයේ දැක්වෙන ආකාරයට මෙයින් විධිවිධාන හලස්වනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදළ විය හැකි ගම් සභා ආඥාපනතේ සියලුම කාර්‍යයන් කරනු සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ 1968 දෙසැම්බර් 31 වැනිදාට වලංගුව පැවති සියලුම අතුරු ව්‍යවස්ථා, එකී අලුත් ගම් ප්‍රදේශයට අදාල වන ප්‍රමාණයට, ඒ එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ වළංගුව පැවතිය යුතු අතර, ඒ අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැළකිය යුතුය.

3. 1968 දෙසැම්බර් 31 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලේ බැරට තිබෙන මුදල 1969 ජනවාරි 1 වැනි දින සිට වැඩ හා හේවාවිස්ස නව ගම් ප්‍රදේශවල ගම් සභාවන්හි පොදු අරමුදලට 9.10 අනුපාතයට බැර කළ යුතුය.

4. 1968 දෙසැම්බර් 31 වැනිදාට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබුණ හෝ එහි පාලනය යටතේ පැවති පහත සඳහන් චංචල දේපල 1969 ජනවාරි 1 වන දින සිට හේවාවිස්ස අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරෙන ලෙස සැළකිය යුතු අතර, පැරණි ගම්සභාවේ ඉතිරි චංචල දේපල වැඩ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරිය යුතුය.

| | |
|---|---|
| අත් පුටු | 5 |
| ලියන මේස | 2 |
| රැස්වීම් ශාලාවේ පරණ මේස | 3 |
| සාමාන්‍ය වන්දේසි | 1 |
| ඔරලෝසු රාමු | 1 |
| සිංහල අඟල් 9 ටයිප් රයිටර් | 1 |
| කොළ විදින පංචර් | 1 |
| වලවල් දෙකේ තීන්ත කුඩු | 1 |
| අල්පෙනෙත්ති දමන වීදුරු භාජන | 1 |
| ටයිම්පීස් ඔරලෝසු | 1 |
| ඇනිට්ටු | 1 |
| යවුල් | 1 |
| වීල් බැරෝස් | 1 |
| කබඩ් | 1 |
| අත් පුටු (නැදුන්) | 12 |
| විලි එල්ලන ලාම්පු | 1 |
| කෝරල දෙකේ සිතියම් | 1 |
| ලොකු පිහිය | 2 |

| | |
|---|---|
| ලිපිගොනු තබන අල්මාරි | 1 |
| පොත් තබන ස්ටෑන්ඩ් | 2 |
| සාමාන්‍ය පොඩි පුටු | 3 |

බුළුවල මාතෘදාරකාභිවෘධි මධ්‍යස්ථානයේ ඇති ගබඩා ලේඛනයට ඇතුළත් සියළුම ද්‍රව්‍ය.

5. 1968 දෙසැම්බර් 31 වන දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපොල 1969 ජනවාරි 1 වන දින සිට එකී ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී ඇති ලෙස සැළකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස් බැරකම් හා බැදීම් එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට අදාල වන ප්‍රමාණයට 1969 ජනවාරි 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට පවරනු ලැබූ ලෙස සැළකිය යුතුය.

7. පැරණි ගම් සභාවේ සේවය කළ සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වූ දායක මුදල් ගෙවීම පිළිබඳව එහි බැදීම් 9 : 10 යන අනුපාතයට වැළඩ සහ හේවාවිස්ස යන නව ගම් ප්‍රදේශයන්හි ගම්සභා අතර බෙදිය යුතුය.

8. මේ උප ලේඛනයෙහි—

"අළුත් ගම් ප්‍රදේශය" යනුවෙන්, අන් ලෙසකින් නියම කළ හොත් මිස, 1968 ජූනි 14 වැනි දින අංක 14,806 දරන ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ආඥාවට අදාළ උප ලේඛනයෙහි විස්තර කෙරෙන වැළඩ ගම් ප්‍රදේශය හෝ හේවාවිස්ස ගම් ප්‍රදේශය අදහස් වේ. "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අලුත් ගම් ප්‍රදේශය ඇති කිරීමට පෙර වූ වැළඩ ගම් ප්‍රදේශය අදහස් වේ.

3–246/1—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—ඕ. 74/39

**ගම්සභා ආඥාපනත**

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1969 දෙසැම්බර් මස 9 වැනි දින,
කොළඹ දීය.

**ආඥාව**

1968 ජූනි 21 වැනි දින අංක 14,806/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ප්‍රාදේශිය ආදායම් නිළධාරි කොට්ඨාශයේ කඳුපිටපත්තු (උතුර හා දකුණ) ගම්ප්‍රදේශය හා අදාළ අඥාවේ සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරණු සඳහා මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට මෙයින් විධි විධාන සලස්වනු ලැබේ.

## උපලේඛනය

1. එක් එක් අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව, එකී අලුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම් සභා ආඥාපනතේ සියලුම කාර්‍යයන් සඳහා, පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ 1968 දෙසැම්බර් 31 වැනිදා වන තෙක් වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා, එකී අලුත් ගම් ප්‍රදේශයට අදාළවන ප්‍රමාණයට ඒ එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ වලංගුව පැවතිය යුතු අතර ඒ අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1968 දෙසැම්බර් 31 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලේ බැරට තිබෙන මුදලින් දෙකෙන් එකක්, 1969 ජනවාරි 1 වැනි දින සිට පිංදෙනිය අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය. ඉතිරි දෙකෙන් එක ගලිගමුව අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

4. 1968 දෙසැම්බර් 31 වැනිදාට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින පහත සඳහන් චංචල දේපල, 1969 ජනවාරි 1 වැනි දින සිට ගලිගමුව අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරෙන ලෙස සැලකිය යුතු අතර, පැරණි ගම්සභාවේ ඉතිරි චංචල දේපල පිංදෙනිය අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරිය යුතුය.

| | |
|---|---|
| ලාච්චු සහිත ලියන මේස | 2 යි |
| මේස | 3 යි |
| පුටු | 12 යි |
| පොඩි පුටු | 2 යි |
| අකුලන පුටු | 5 යි |
| අල්මාරි | 2 යි |
| සිංහල ටයිප්රයිටර් | 1 යි |
| බංකු | 1 යි |
| තීන්ත කුඩු | 1 යි |
| කාර්‍යාල සීනු | 1 යි |
| දින දර්ශන | 1 යි |
| ජාතික කොඩි | 1 යි |
| පන්චර් | 2 යි |
| රූල් පොලු | 2 යි |
| රබර් සීල් | 2 යි |
| සීල් ස්ටෑන්ඩ් | 1 යි |
| රාක්ක | 2 යි |
| කාර්‍යාල ලිපි තට්ටු | 3 යි |
| කුණු කූඩා | 1 යි |
| පිහියා | 1 යි |
| කඩදාසි උල් | 1 යි |
| බිත්ති ඔරලෝසු | 1 යි |
| සාමාන්‍ය සීල් | 1 යි |
| දින සීල් පෑඩ් | 1 යි |
| කඩදාසි බරු | 3 යි |
| ස්පොන්ජ් කේස් | 2 යි |
| දැන්වීම් පුවරු | 1 යි |
| ලංකා ජනපොත් | 1 යි |
| ගම් සිතියම් | 1 යි |
| පින්තූර රාමු | 1 යි |
| පර්ගියුසන් නාමාවලි | 1 යි |
| අඩි 50 ටේප් රෝල් | 1 යි |
| අඩි 25 ටේප් රෝල් | 1 යි |
| බේසම් | 1 යි |
| උදලු | 6 යි |
| වානේ කම්බි | 1 යි |
| පොරව | 1 යි |
| චාන්ති | 6 යි |
| ජේක්ක | 1 යි |
| වීල් බැරෝ | 1 යි |

බල්ලපාන චිකිත්සාගාරයට අයත් පහත සඳහන් උපකරණ :

| | |
|---|---|
| අල්මාරි | 1 යි |
| ඇඳන් | 1 යි |
| පුටු | 3 යි |
| බේසන් | 2 යි |
| කූඩා | 1 යි |
| ස්ක්‍රීන් | 1 යි |
| මේස | 1 යි |

අඹුගොඩ චිකිත්සාගාරයට අයත් පහත සඳහන් උපකරණ :

| | |
|---|---|
| මේස | 1 යි |
| පුටු | 2 යි |
| බේසන් | 1 යි |
| ස්ත්‍රික් | 1 යි |

දමුණුපොල චිකිත්සාගාරයට අයත් පහත සඳහන් උපකරණ :

| | |
|---|---|
| ලියන මේස | 2 යි |
| ඇඳන් | 1 යි |
| අත් පුටු | 2 යි |
| සාමාන්‍ය පුටු | 1 යි |
| අල්මාරි | 1 යි |
| බංකු | 2 යි |
| බේසම් | 1 යි |
| බේසම් ස්ටෑන්ඩ් | 1 යි |
| ස්ක්‍රීන් | 1 යි |
| සබන් පෙට්ටි | 1 යි |
| ට්‍රේ | 1 යි |
| මේස | 2 යි |
| අත්පිසින තුවා | 1 යි |
| ඇඳ ෂීට් | 2 යි |
| කොට්ට උර | 2 යි |
| දොර රෙදි | 1 යි |
| ජනෙල් රෙදි | 1 යි |

5. 1968 දෙසැම්බර් 31 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල, 1969 ජනවාරි 1 වැනි දින සිට එකී ඉඩම්, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණයතුරුස්, බැරකම් හා බැඳීම් එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට අදාලවන ප්‍රමාණයට, 1969 ජනවාරි 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම් සභාවේ සේවයේ නියුක්තව සිටියාවූ සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දායක ගෙවීම පිළිබඳව එහි බැඳීම් 1:1 අනුපාතයට ගලිගමුව හා පින්දෙනිය නව ගම් ප්‍රදේශයන්හි, ගම් සභා අතර බෙදිය යුතුය.

8. මේ උපලේඛනයෙහි :

"අලුත් ගම් ප්‍රදේශය" යනුවෙන්, අන් ලෙසකින් නියම කළ හොත් මිස, 1968 ජූනි 21 වැනි දින අංක 14,806/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ආඥාවට අදාල උපලේඛනයෙහි විස්තර කැරෙන පින්දෙනිය ගම් ප්‍රදේශය හෝ ගලිගමුව ගම් ප්‍රදේශය, අදහස් වේ.

"පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අලුත් ගම් ප්‍රදේශය ඇති කිරීමට පෙර වූ කඳුපිටපුන්තු (උතුර හා දකුණ) ගම් ප්‍රදේශය අදහස් වේ.

3–246/2—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා දේපළ බද්ද

1967 අංක 8 දරණ පනතේ අංක 2 දරණ වගන්තිය මගින් සංශෝධිත, (252 වන අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 230 (1) වගන්තිය යටතේ හා එකී වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති වරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, 1970 වර්ෂය සඳහා සභාව විසින් නියම කරනු ලබන සීමා කිරීම, සුදුසුකම් හා කොන්දේසිවලට යටත්ව මඩකලපුව මහ නගර සභාවේ අංක 15, 16, 17, 18 හා 19 දරණ ඡන්ද කොට්ඨාශවල පිහිටි සියළු වර්ගයේම ගෙවල්, ගොඩනැගිලි, ඉඩම් සහ කුලී ගෙවල් වල වාර්ෂික වටිනාකමින් සියයට 7ක දේපළ බද්දක් සභාව විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්, සුදුසු කම් සහ කොන්දේසි වලට යටත් කොට සමාන කොටස් හතරකින්, එනම් පිළිවෙළින් 1970 මාර්තු 30 දින, 1970 ජූනි 30 දින, 1970 සැප්තැම්බර් 30 දින හා 1970 දෙසැම්බර් 31 දිනයන්හි හෝ ඊට ප්‍රථම, ගෙවා නිම කළ හැකි පරිදි, මඩකලපුව මහ නගර සභාව විසින් පනවා අය කර ගැනීමට තීරණය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970.3.1 දින,
කොළඹ.

3–231—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ජී.—බී. 122/37

## බණ්ඩාරවෙල නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපණම් බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130 (ආ) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතුව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි සීමාවලට හා නිදහස් කිරීම්වලට යටත්ව පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවිය හැකිවන පරිදි බණ්ඩාරවෙල නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතක්වූ ජලය පිළිබඳ විශේෂ වරිපණම් බද්දක් බණ්ඩාර වෙල නගර සභාව විසින් 1969 වර්ෂයට මෙන් 1970 වර්ෂය සඳහාත් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 3. 1 දින,
කොළඹ දීය.

3–233—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ජී.—බී. 24/65.

## වව්නියා නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1970 සඳහා දේපළ බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය යටතේ හා එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමතිය ඇති ව, නගර සභාව විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්, සුදුසු කම් හා කොන්දේසිවලට යටත්ව, වව්නියා නගරය තුළ පිහිටි සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට දෙළහ බැගින් වූ දේපළ බද්දක්, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30 සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවි ය හැකි වන අන්දමට 1970 වර්ෂය සඳහා වව්නියා නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970.3.1,
කොළඹ දී ය.

3–230—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 40 අ වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික් කයේ නිවිතිගල ගම්ප්‍රදෙශයේ ගම්සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් යෝජනාව එම ආඥාපනතේ 46 වන වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් දෙන ලද එකඟත්වය ඇතිව, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කර ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. එම්. පීරිස්,
පළාත් පාලන අමාත්‍යාංශයේ වැඩ බලන
සථිර ලේකම්.

1969 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ දීය.

### යෝජනාව

මීට යාකොට ඇති උපලේඛනයෙහි සඳහන් ප්‍රදේශ තුළ පිහිටි සියළුම ගොඩනැගිලි සහ ඉඩම්වල වාර්ෂික වටිනාකමින් සියයට හයකට නො වැඩිවූ ජලබද්දක් 1970 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි, සමාන කොටස් හතරකින්, එනම් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම් බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලදී හෝ ඊට ප්‍රථම ගෙවිය යුතුවන පරිද්දෙන් එකී ප්‍රදේශ තුළ පනවා අයකිරීමට, 1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපන තේ 40 අ දරණ වගන්තිය යටතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිති ගල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් මෙයින් යෝජනා කරනු ලැබේ.

### උපලේඛනය

**නිවිතිගල :** නිවිතිගල ජලසම්පාදන ක්‍රමය යටතේ ජලය බෙදාහැරීමේ ජලකණු පිහිටා තිබෙන ස්ථානවල ජලනල මාර්ගයේ දිග

අතට එක් පැත්තකට දම්වැල් පහ බැගින් ද, ජලනල මාර්ගයේ හරස් අතට එක් පැත්තකට දම්වැල් තුන බැගින් ද සිටින සේ දෙඩම්පාවත්ත සහ පාරවත්ත යන ගම්මණ්ඩිද ඇතුළු ප්‍රදේශය.

දැල : දැල ජලසම්පාදන ක්‍රමය යටතේ ජලය බෙදාහැරීමේ ජලකණු පිහිටා තිබෙන ස්ථානවල ජලනල මාර්ග දිගේ එක් පැත්තකට දම්වැල් පහ බැගින් ද, ජලනල මාර්ගයේ හරස් අතට එක් පැත්තකට දම්වැල් තුන බැගින් ද, ඇතුළත් වන ප්‍රදේශය

කරවිට : කරවිට ජලසම්පාදන ක්‍රමය යටතේ ජලය බෙදාහැරීමේ ජල කණු පිහිටා තිබෙන ස්ථානවල ජලනල මාර්ගයේ දිග අතට එක් පැත්තකට දම්වැල් පහ බැගින් ද, ජලනල මාර්ගයේ හරස් අතට එක් පැත්තකට දම්වැල් තුන බැගින් ද ඇතුළත් වන ප්‍රදේශය

වටාපොත : නිවිතිගල ජල සම්පාදන ක්‍රමය යටතේ වටාපොත ජලය බෙදා හැරීමේ ජලකණු පිහිටා තිබෙන ස්ථානවල ජලනල මාර්ගයේ දිග අතට එක් පැත්තකට දම්වැල් පහ බැගින් ද, ජලනල මාර්ගයේ හරස් අතට දම්වැල් තුන බැගින් ද ඇතුළත් වන ප්‍රදේශය.

3–241—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 43/69

## ගම් සභා ආඥාපනත

මන්නාරම දිස්ත්‍රික්කයේ වන්කාලෙයි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරන ලද (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 40 (අ) වන වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව ඒ ආඥාපනතේ 46 වන වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් දෙන ලද එකඟත්වය ඇතිව, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කර ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970.1.8 වන දින,
කොළඹදී ය.

### යෝජනාව

මෙම ගම් ප්‍රදේශයේ සීමා ඇතුළත පිහිටි සියලුම ගොඩනැගිලි සහ ඉඩම්වල වාර්ෂික වටිනාකමින් සියයට හයක ජල බද්දක් සමාන කොටස් හතරකින්, එනම්, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30 සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලදී හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු වන පරිද්දෙන් 1970 වර්ෂය සඳහා පනවා අය කිරීමට (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 40 (අ) ව වගන්තිය යටතේ මෙම සභාව විසින් මෙයින් යෝජනා කරනු ලැ

3–252—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.බී. 38/69.

## ගම්සභා ආඥාපනත

යාපනය දිස්ත්‍රික්කයේ අරාලි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ඇති (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 40 (අ) සහ 40 (ආ) යන වගන්ති යටතේ වූ යෝජනාව ඒ ආඥාපනතේ 46 වන වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් දෙන ලද එකඟත්වය ඇතිව, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කර ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969. 12. 29 දින,
කොළඹ දීය.

### යෝජනාව

මීට යාකොට ඇති උපලේඛනය මගින් නියමිත ප්‍රදේශ තුළ පි සියලුම ගොඩනැගිලි සහ ඉඩම්වල වාර්ෂික වටිනාකමින් සියයට හ වූ ජල බද්දක් 1969 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි දෙසැ 31 යන දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු වන පරිද්දෙන් එකී ප්‍රදේ තුළ පනවා අය කිරීමට (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපන 40 (අ) සහ 40 (ආ) දරන වගන්ති යටතේ යාපනය දිස්ත්‍රික්ක අරාලි ගම් ප්‍රදේශයේ ගම්සභා විසින් මෙයින් යෝජනා කර සි ලැබේ.

### උපලේඛනය

අංක 13 දරන ඡන්ද කොට්ඨාශය—නාගෙනුමඩම ප්‍රදේශය.

ජලය බෙද හැරීමේ ජල කණු පිහිටා තිබෙන ජල සම්පාදන යෝ ක්‍රමයේ ජල නල මාර්ගවල දෙපැත්තේ අඩි 500 ක් ඇතුළත වූ ප්‍රදේ

3–220—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කි සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදහරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළ පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ ( සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෙ අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේව පත් කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් ස තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට ( කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,429 ව අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන පළාත් පාලන සේවා වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගු යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනන්දරු විශ් වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක මුදලක් ගෙවීමට නි කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියා වැටුපෙන් සියයට 3ක දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පු මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නි කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේව අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙ වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද ය පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැව වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබේ.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.

(ඈ) **කාර්යක්ෂමතා කඩයිම.**—පත්වීම් ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගත්තා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධි විධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නා වූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදාළ නොවේ.

**5. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

**6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

**8. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදානම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.–(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

———— තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2 සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3 තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු :————, මාස :————, දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11 (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම් :

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබූවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ කිවිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස් සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.

## පළාත් පාලන සේවය

### පොදු සෞඛ්‍ය සේවිකා තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරුවන් මාරුකර යැවීමට හැකිය.

2. **ඒකාබද්ධ වැටුප :** තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය—

(i) වර්ෂයකට රු. 5,304න් පටන් ගෙන, වර්ෂයකට රු. 144 බැගින් 9 වරක් වැඩිවී, රු. 6,600 දක්වා නගී. එහි රු. 5,736 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව, විවාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ. මේ වැටුප් ක්‍රමය පහත 3 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් ඇති පුහුණු වූ පොදු සාත්තු සේවිකාවන් සඳහා ය.

(ii) වර්ෂයකට රු. 3,864—144×18—රු. 6,456 වැටුප් ක්‍රමය. එහි රු. 5,304 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව, විවාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ. මේ වැටුප් ක්‍රමය පහත 3 (ආ) හා (ඇ) ඡේදවල සඳහන් සුදුසුකම් සහිත සේවිකාවන් සඳහා ය.

තෝරාගනු ලබන අපේක්ෂිකාවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔවුනට අදාළ වැටුප් ක්‍රමයෙහි සුදුසු පියවරක පිහිටුවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය, වින්නඹු සේවිකා සහතිකය සහ පොදු සෞඛ්‍ය සේවිකා සහතිකය, **හෝ**

(ආ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය සහ වින්නඹු සේවිකා සහතිකය, **හෝ**

(ඇ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය (සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි.)

4. අපේක්ෂකයින්ට, පත්කරනු ලබන ප්‍රාදේශීය බලමංඩල මගින් නිළ ඇඳුම් සපයනු ලැබේ. ඒ ප්‍රාදේශීය බලමංඩලවල සීමාවන් ඇතුළත පදිංචි වන ලෙස ඔවුනට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ පත්‍රයට අනුව පිළියෙල කොට, 1970 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘතියෙහි 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි :—

**විශේෂ සුදුසුකම් : :—**

(1) සාත්තු සේවය පිළිබඳ ඇති සුදුසුකම්වල විස්තර :————.

(2) පුහුණු වූ පොදු සෞඛ්‍ය සාත්තු සේවිකාවන් ද යනු :————.

(3) වින්නඹු කර්මය පිළිබඳ පුහුණුව ලබා තිබේද යනු :————.

7. අයදුම් පතක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු අයදුම් පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානමකට මුහුණ දෙති.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොවේ.

9. අවශ්‍ය සාත්තු සේවිකා සහතිකවල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපත් ද නොමැතිව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11 ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දින සිට සති 2 ක කාලයක් ඇතුළතදී සුදුසුකම් ඇති අයදුම් පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 මාර්තු මස 3 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ.

3–237—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### III වැනි ශ්‍රේණියේ සරප් සහ කැෂියර් තනතුරු

පළාත් පාලන සේවයෙහි සරප් සහ කැෂියර්වරුන්ගේ සේවයේ III වැනි ශ්‍රේණියේ සරප් සහ කැෂියර් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගනු ලැබෙන අයදුම්කරුවන්ගේ නම්, පත්වීම් බලාපොරොත්තු වන්නන්ගේ ලේඛනයට ඇතුළත් කර, පුරප්පාඩු ඇතිවන පරිදි පත්වීම් දෙනු ලැබේ. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා ඔවුහු සූදානම් විය යුතුය.

2. මෙම පරීක්ෂණය 1970 මැයි මස 4 වැනි දින විභාග කොමසාරිස් විසින් කොළඹ දී පවත්වනු ලැබේ.

3. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 3,270—21×90—රු. 5,160. රු. 3,900 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) වයස : 1970. 3. 31 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු, 35 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ යටත් පිරිසෙයින් පහත සඳහන් විභාගවලින් සමත්වී සිටිය යුත්තාහ :—

(i) සිංහල/දෙමළ සහ ගණන් තැබීම විෂයයන් වශයෙන් ඇතිව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර (ඉංග්‍රීසි) විභාගයෙන් හෝ,

(ii) ගණන් තැබීම විෂයයක් වශයෙන් ඇතිව ලත් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර සිංහල හෝ දෙමළ විභාගයෙන් හෝ,

(iii) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන්. මෙම විෂයයන් හයෙන් තුනක්, සිංහල/දෙමළ, අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය සහ ගණන් තැබීම විය යුතුයි.

බැංකු කටයුතු පිළිබඳ දැනුමක් හෝ කැෂියර් කෙනෙකු හෝ සරප් කෙනෙකු ලෙස පළපුරුද්ද ඇති අය ගැන විශේෂයෙන් සළකනු ලැබේ.

සුදුසුකම් ඇති අයදුම්කරුවනට ගණන් තැබීම, කැෂියර් කෙනෙකුගේ රාජකාරි හා සරප් කෙනෙකුගේ රාජකාරි සම්බන්ධයෙන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටින ලෙස නියම කරනු ලැබේ.

5. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන රු. 3,000 දක්වා වූ විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් සහ රු. 1,500 ක මුදලින් ඇප තබන ලෙස නියම කරනු ලැබේ. (මේ මුදල, පත්වීම් ලැබීමේදී ආරම්භක ඇපයක් වශයෙන් රු. 250 ක් ගෙවා, මාස්පතා රු. 10 යේ කොටස් මුදල් වලින් ගෙවා හමාර කළ හැකිය.)

6. සරප් කෙනෙකු හෝ කැෂියර් කෙනෙකු ලෙස පළපුරුද්ද සහ බැංකු කටයුතු පිළිබඳ දැනුම පිළිබඳ සම්පූර්ණ විස්තර අයදුම්පත්වල අඩංගු විය යුතුයි. මෙම විස්තර සහතික මගින් සනාථ කළ යුතුයි.

7. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1970. 3. 31 වැනි දිනට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

9. අයදුම්පත්‍ර හෝ ඊට අදළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පෞද්ගලික නාමට නොවේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11. තැපැලේදී නැතිවුණු හෝ පමාවුණු අයදුම්පත් සම්බන්ධ පැමිණිලි සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම පමා කරන අපේක්ෂකයෝ තමන්ම එවැනි අවදානමකට මුහුණ දෙති.

12. අයදුම් පත්‍රයට රු. 5 ක් වටිනා මුද්දර අලවා, ඒ මත අපේක්ෂකයාගේ අත්සන යොදා අවලංගු කළ යුතුයි. එසේ මුද්දර අලවා නොතිබුණහොත් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 2 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

3–236—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### පරීක්ෂක තනතුරු

යථෝක්ත තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—තනතුරට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණය, වර්ෂයකට රු. 4,152—144×17—180×8—රු. 8,040 යනුවෙනි. එහි රු. 6,024ක් වූ වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ද, රු. 7,500 ක් වූ වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණ හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු ඕවර්සියර්වරුන්ගේ සහ අවශේෂ ප්‍රාදේශීය බල මණ්ඩලයන්හි කර්මාන්ත අධිකාරීන්ගේ සහ පරීක්ෂකවරුන්ගේ අයදුම්පත් පමණක් පිළිගනු ලැබේ.

අපේක්ෂකයිනට පහත දක්වන සුදුසුකම් තිබිය යුතුයි :—

(i) අවුරුදු හතක ප්‍රායෝගික පළපුරුද්දක්. මෙයින් යටත් පිරියෙයින් අවුරුදු දෙකක්වත් සිවිල් ඉංජිනේරු කර්මාන්තය පිළිබඳව විය යුතුයි. එසේ නැතහොත් ;

(ii) සිවිල් ඉංජිනේරු කර්මාන්තය පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු පහක ප්‍රායෝගික පළපුරුද්දක්.

පහත දක්වන ශිල්පීය සුදුසුකම්වලින් එකක් ද අයදුම්කරුවනට තිබිය යුතුයි :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය (සිවිල්) ;

(ආ) ලංකා කාර්මික විද්‍යාලයයේ නාගරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව) ;

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයයේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව) ;

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයයේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව) ; එසේ නැතහොත් ඊට සමාන හෝ උසස් සුදුසුකමක්.

4. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර ඇති පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1970. 4. 7 දිනට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලද බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 3 දින,
කොළඹ,
තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

3–235—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### නියෝජ්‍ය රස පරීක්ෂක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත් කැඳවයි.

2. තෝරාගනු ලබන අයදුම්කරු ප්‍රථමවරට කොළඹ නගර සභාවට පත් කරනු ලැබේ.

3. වැටුප.—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 6,720—360×12—480×11—16,320 කි. වර්ෂයකට රු. 11,040 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

(අ) රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද මීට අමතරව ගෙවනු ලැබේ.

(ආ) බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ ඒකාබද්ධ සාමාජිකත්වයක් නොදරන නිලධාරියෙකුට මෙම වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 11,040 යන වැටුපෙන් ඔබ්බට යා නොහැක.

(ඇ) පත්වීමක් ලබන අවධියේ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ ඒකාබද්ධ සාමාජිකත්වයක් දරණ නිලධාරියෙකුට රු. 7,800 ක වාර්ෂික වැටුපක් ගෙවනු ලැබේ.

4. සුදුසුකම්.—අයදුම්කරුවන් පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ උපාධිධාරීන් විය යුතුය. 1 වැනි හෝ 2 වැනි පන්තියේ සාමාර්ථයක් ලබා ඇති අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. තෝරාගනු ලබන අයදුම්කරුට කොළඹ නගර සභා සීමාව තුළ වාසය කිරීමට නියම කරන අතර, පෞද්ගලික වෘත්තියෙහි යෙදීම තහනම්ය.

6. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කර 1970.3.31 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

8. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

3–234—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය

### විදුලිය ෆෝර්මන් තනතුර

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ විදුලිය ෆෝර්මන් තනතුර සඳහා ද්විතීයනයක් අපේක්ෂා කරන පළාත් පාලන සේවයේ I හෝ II ශ්‍රේණියේ විදුලිය ෆෝර්මන් වරුන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. පළාත් පාලන සේවයේ දැනට ලබන වැටුපට අමතරව මූලික වැටුපෙන් සියයට 33 1/3 ක ද්විතීයනය දීමනාවක් ගෙවනු ලැබේ. මීට අමතරව රජයේ ක්‍රමයට ජීවනාධාර, විශේෂ ජීවනාධාර, අතුරු දීමනා හා ගෙවල් කුලී දීමනාවක් ද ගෙවනු ලැබේ.

3. මහා නාගරික සභා, පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා, හෝ ගම් සභාවල විදුලි යෝජනා ක්‍රම යටතේ පස් අවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබෙන්නන් ගැන විශේෂයෙන් සලකා බලනු ඇත.

4. ස්වකීය අයදුම් පත් පළාත් පාලන ප්‍රධානීන් හා පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා මගින් එවිය යුතු අතර, එහි පිටපතක් පමණක් කෙළින්ම මෙම කාර්යාලයට එවිය යුතුය. මණ්ඩලීය සේවය සඳහා ද්විතීයනය කිරීමට එකඟවූවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ගැන සලකා බලනු ලැබේ.

5 ලිපිනය ලියූ, මුද්දරයක් සහිත දිග ලියුම් කවරයක් මෙම කාර්යාලයට එවීමෙන් අයදුම් පත් ෆෝර්ම ලබාගත හැක. සියලුම අයදුම් පත්‍ර 1970 මාර්තු 20 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙනසේ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වෙත එවිය යුතුයි.

ඩඩ්ලි දිසානායක,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ
සාමාන්‍යාධිකාරී.

1970 පෙබරවාරි මස 22 වැනි දින,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දීය.

3–238—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## අතුරු ව්‍යවස්ථා

එල්.ජී.—බී. 86/46.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ මානිපායි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

### අප්‍රසන්න හා අනතුරුදායක ව්‍යාපාර

1. (1) පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර ලෙස සැලකිය යුතු ය:—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
(2) තොග ගණනේ හෝ සිල්ලරට විකිණීම සඳහා නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(3) විනාකිරි සෑදීම.
(4) කොම්පෝස්ට් හෝ කෘත්‍රිම පොහොර සෑදීම.
(5) සබන් නිෂ්පාදනය.
(6) පුවක් පදම් කිරීම.
(7) ගෝනි 3 කට වඩා නම් හෝ ඇටකටු හෝ කෘත්‍රිම පොහොර ගබඩා කිරීම.
(8) මාළු අයිස් දැමීම.
(9) සුරුට්ටු නිෂ්පාදනය.
(10) දුම්කොළ ගබඩා කිරීම.
(11) බීඩි නිෂ්පාදනය.
(12) විස්කෝතු නිෂ්පාදනය.
(13) රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම.
(14) දර ගබඩාවක් තබා ගැනීම.

(2) පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර ලෙස සැලකිය යුතු ය:—

(1) පිදුරු ගබඩා කිරීම.
(2) යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් හෝ තල තෙල් සිඳීම.
(3) සෙක්කු මගින් පොල් තෙල් හෝ තල තෙල් සිඳීම.
(4) ස්වර්ණාභරණ නිපදවීම.
(5) කම්මලක් පවත්වාගෙන යාම.
(6) මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
(7) අම්ලකර වායුව පාවිච්චි කරන කම්මලක් පවත්වාගෙන යාම.
(8) හාල් මෝලක් තබා ගැනීම.
(9) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලි වලට කැඩීම.
(10) සිසිල් බීම සෑදීම සහ/හෝ ගබඩා කිරීම.
(11) දුම්කොළ පදම් කිරීම හෝ වේලීම.
(12) බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පොළක් පවත්වාගෙන යාම.
(13) මෝටර් වාහන සර්විස් කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පොළක් පවත්වාගෙන යාම.
(14) තෙල් බලෙන් හෝ වෙනත් දැවෙන සුළු ද්‍රව්‍යයකින් හෝ වාෂ්ප බලයෙන් හෝ විදුලි බලයෙන් හෝ ක්‍රියා කරවන යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන යම් කිසි කර්මාන්තයක්.
(15) (1) යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන,
(2) යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන,
ලී ඉරන වලක් පවත්වාගෙන යාම.

(3) පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතු ය:—

(1) බැටරි චාජ් කිරීම.
(2) සෝඩා නිෂ්පාදනය.

3–219—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය වන)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 4 (1) (සී) වැනි වගන්තිය යටතේ ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ, ඩබ්ලිව්. සී. එල්. පෙරේරා මහතා, 1970. 3. 2 වැනි දින සිට අම්පාර දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් පත් කරන්නට යෙදුන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 මාර්තු මස 2 වැනි දින,
කොළඹ දීය.

3–218—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## වරකාපොල උප නගර සභාව

40(11) වැනි මුදල් රෙගුලාසිය යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද, පහත සඳහන් වන මුදල්, මුදල් හිඟවේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ට කෑගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව, මාරු කිරීමට 1969 දෙසැම්බර් මස 31 වෙනි දින පවත්වන ලද රැස්වීමේ අංක 6 දරණ යෝජනාවෙන් සම්මත කර ගන්නා ලදී.

### 1 වෙනි කොටස—සාමාන්‍ය

**මුදල් ඉතිරිවන වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 1. නිලධාරි වැටුප්— | | |
| (ජී) ජීවනාධාර ... ... ... | 1,315 | 0 |
| 2. සංස්ථා වියදම්— | | |
| (ඒ) දීමනා (අන් අන්දමකින් වෙන් නොකළ) ... | 100 | 0 |
| (සී) අයකැමි ගාස්තු (අන් අන්දමකින් අය නොකළ) ... | 150 | 0 |
| (ඊ) නීති උපදේශක ගාස්තු ... ... | 100 | 0 |
| 4. ආධාර සහ පරිත්‍යාග ... ... ... | 100 | 0 |
| ජී.—සුනඛයින් ලියා පදිංචි කිරීම : | | |
| 1. සුනඛ ඝාතනය ... ... ... | 60 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි (අන් අන්දමකින් වෙන් නොකළ) | | |
| 8. ජීවණාධාර ... ... ... | 550 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය : | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඇෆ්) විශනාසක ද්‍රව්‍ය ... ... | 100 | 0 |
| 2. කැලිකසල ශෝධනය— | | |
| (ඊ) ජීවනාධාර ... ... ... | 700 | 0 |
| 3. වැසිකිළි ශෝධනය— | | |
| (ඊ) වැසිකිළි නඩත්තුව ... ... | 200 | 0 |
| (ජී) ඉදිකිරීම් ... ... ... | 2,734 | 0 |
| (එච්) ජීවනාධාර ... ... ... | 545 | 0 |
| 5. ජල සම්පාදනය— | | |
| (ඊ) ඉදිකිරීම ... ... ... | 300 | 0 |
| 6. රෝහල්— | | |
| (ඩී) ජීවනාධාර ... ... ... | 175 | 0 |
| | 7,129 | 0 |

**වැඩිපුර මුදල් අවශ්‍ය වන වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 1. නිලධාරි වැටුප් (අන් අන්දමකින් වෙන් නොකල)— | | |
| (ඒ) ලේකම් ... ... ... | 416 | 0 |
| (බී) ලිපිකරුවෝ ... ... ... | 1,214 | 0 |
| (සී) ආදායම් නිරීක්ෂකයෝ ... ... | 323 | 0 |
| (ඩී) කාර්යාල කාර්ය සහායක ... ... | 461 | 0 |
| 2. සංස්ථා වියදම්— | | |
| (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රකාශන සහ මුද්දර ගාස්තු ... | 300 | 0 |
| (ජේ) හදිසි වියදම් ... ... ... | 125 | 0 |
| (කේ) කාර්යාල භාණ්ඩ හා උපකරණ ... | 25 | 0 |
| (ඇම්) නිලධාරි මංඩලයට අතිකාල දීමනා ... | 145 | 0 |
| බී.—මංමාවත් : | | |
| 1. වේතන සහ දෛනික වැටුප්— | | |
| (සී) කම්කරුවෝ ... ... ... | 40 | 0 |
| 12. නව කර්මාන්ත ... ... ... | 40 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි (අන් අන්දමකින් වෙන් නොකළ) : | | |
| 1. දෛනික වැටුප් ... ... | 674 | 0 |
| 4. නඩත්තු කිරීම ... ... ... | 20 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය : | | |
| 2. කැලි කසල ශෝධන— | | |
| (ඒ) දෛනික වැටුප් ... ... | 2,526 | 0 |
| (බී) ගොන් කරත්ත සහ ලොරි ... ... | 148 | 0 |
| 6. රෝහල්— | | |
| (ඒ) දෛනික වැටුප් ... ... | 672 | 0 |
| | 7,129 | 0 |

### විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| විදුලි 1 විද්‍යුත්පාදනය | | |
| (ඩී) විදුලි බලය මිලදී ගැනීම ... ... | 3,139 | 0 |
| 6. ව්‍යාප්තිය සහ සංවර්ධනයෝ ... ... | 482 | 0 |
| 10. ජීවනාධාර ... ... ... | 500 | 0 |
| | 4,121 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| විදුලි 2 ප්‍රතිසංස්කරන හා නඩත්තු කිරීම— | | |
| (ඒ) ගොඩනැගිලි ... ... ... | 800 | 0 |
| (සී) මාපක යන්ත්‍ර, විදුලිය යතුරු හා වෙනත් භාණ්ඩ ... | 76 | 0 |
| 4. පාලනය හා සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) පාලන වේතන හා දීමනා (අන් අයුරින් වෙන් නොකල) ... ... ... | 509 | 0 |
| (බී) බාහිර සේවක වේතන හා දීමනා (අන් අයුරින් වෙන් නොකල) ... ... ... | 1,754 | 0 |
| 9. පොදු ආදායමෙන් ලබා ගත් අත්තිකාරම් ආපසු ගෙවීම | 982 | 0 |
| | 4,121 | 0 |

ඩබ්ලිව්. ඒ. ඇල්බට,
සභාපති,
වරකාපොල උප නගර සභාව.

වරකාපොල උප නගර සභා කාර්යාලයේදී,
1970 පෙබරවාරි මස 5 වෙනි දින දී ය.

අනුමත කරමි.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,

1970 පෙබරවාරි 27 වෙනි දින,
පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලය,
කෑගල්ල.

3-215/1—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## වරකාපොල උප නගර සභාව

### 40 (11) වෙනි මුදල් රෙගුලාසිය යටතේ්ඉල්ලීම—අය–වැය ලේඛණය

1969 වර්ෂයේ අය–වැය ලේඛණයෙහි ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද, පහත සඳහන් වන මුදල්, මුදල් හිඟවේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ට කෑගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමැතියට යටත්ව, මාරු කිරීමට 1969 නොවැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද රැස්වීමේ අංක 24 දරණ යෝජනාවෙන් සම්මත කර ගන්නා ලදී.

| මුදල් ඉතිරි වන වැය ශීර්ෂ | රු. ශ. | වැඩිපුර මුදල් අවශ්‍ය වන වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|---|---|
| විදුලි | | | |
| විදුලි 1 විද්‍යුත්පාදනය— | | විදුලි 2 ප්‍රතිසංස්කරන හා නඩත්තු— | |
| (ඞී) විදුලි බලය මිලදී ගැනීම ... ... | 410 0 | (සී) මාපක යන්ත්‍ර විදුලි යතුරු හා වෙනත් භාණ්ඩ... | 60 0 |
| | | 4. පාලනය හා සාමාන්‍ය වියදම්— | |
| | | (බී) බාහිර සේවක වේතන හා දීමනා (අන් අයුරින් වෙන් නොකල) ... ... ... | 350 0 |
| | 410 0 | | 410 0 |

ඩබලිව්. ඒ. ඇල්බට්,
සභාපති,
වරකාපොල උප නගර සභාව.

1970 ජනවාරි මස 19 වෙනි දින,
වරකාපොල උප නගර සභා කාර්යාලයේ දී ය.

අනුමත කරමි.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස් තුමා,

1970 පෙබරවාරි 27 වෙනි දින,
කෑගල්ල පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

3-215/2—70. 3. 13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## වරකාපොල උප නගර සභාව

### අය වැය වාර්තාව 1970

### I වෙනි කොටස—සාමාන්‍ය

| ආදයම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම :— | |
| (1) දේපල බදු ... ... ... | 53,987 0 |
| (2) රථවාහන සහ සතුන් පිළිබඳ බදු ... ... | 175 0 |
| (3) බලපත්‍ර ගාස්තු ... ... ... | 10,915 0 |
| (4) වෙනත් බදු ... ... ... | — |
| (5) මුද්දර ගාස්තු ආපසු ගෙවීම ... ... | 400 0 |
| (6) පිට රට මද්‍යපාන බලපත්‍ර මුදල් ආපසු ගෙවීම ... | — |
| (7) අකින් අය වන්දි මුදල් ... ... | — |
| (8) උසාවියෙන් දඩ මුදල් (අන් තැනක නොසඳහන්) ... | — |
| (9) වෙන්දේසිකරුවන්ගේ හා බ්‍රෝකර්වරුන්ගේ බලපත්‍ර ... | 50 0 |
| (10) පොළිය ... ... ... | 50 0 |
| (11) පරණ බඩු විකිණීම... ... ... | 150 0 |
| (12) වැඩිමනත් ගෙවීම් ආපසු ලබාගැනීම ... ... | — |
| (13) වරෙන්තු ගාස්තු ... ... ... | 1,250 0 |
| (14) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 18,699 9 |
| (15) මිශ්‍ර අය ... ... ... | 340 0 |
| (16) රජයෙන් ආධාර දීමනා ... ... | 1,500 0 |
| එකතුව ... | 87,516 0 |
| බී.—මහා මාර්ග :— | |
| (1) කම්කරු බදු වෙනුවට උපකාර මුදල ... | 895 0 |
| (2) වෙනත් එකතු කිරීම් මාර්ග අලාභකිරීම් දඩ (98) දඩාවතේ යන ගවයින් බැඳ විකිණීමෙන් සහ දඩ (104) නිල තහඩු සහ අයකිරීම් ලේඛන විකිණීම ... | — |
| එකතුව ... | 895 0 |

| ආදයම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. ශ. |
|---|---|
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | |
| (1) බදු මුදල් ... ... ... | — |
| (2) අස්වැන්න විකිණීම ... ... ... | — |
| (3) ඉඩම් විකිණීම ... ... ... | — |
| එකතුව ... | — |
| ඩී.—සනීපාරක්ෂාව :— | |
| (1) සාමාන්‍ය— | |
| (ඒ) 4 වැනි කොටස යටතේ දඩ ... ... | — |
| (බී) වින්නඹු මාතාවන්ගේ සේවයට ගාස්තු ... | — |
| (සී) මාතෘ හා දරක සුභසාධනය ... ... | — |
| (1) රජයේ ආධාර ... ... ... | 700 0 |
| (2) වෙනත් ලැබීම් ... ... | — |
| (2) කසළ ශෝධනය— | |
| (ඒ) ගාස්තු 170 (9) (බී) ... ... | — |
| (බී) කුණු කසළ විකිණීම 132 ... ... | 25 0 |
| (සී) කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කම්කරුවන්ගෙන් දඩ | 25 0 |
| (3) වැසිකිළි පවිත්‍ර කිරීම— | |
| (ඒ) අයබදු 143 (බී) ... ... ... | — |
| (බී) ගාස්තු 170 (9) (බී) ... ... | 840 0 |
| (සී) කුණු කසළ විකිණීම 132 ... ... | — |
| (ඩී) කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කුලීකරුවන්ගේ දඩ | — |
| (4) සත්වඝාතක ස්ථානය හා ගව මඩුව— | |
| (ඒ) ගාස්තු 156 (10) (ඒ) ... ... | 2,500 0 |
| (බී) කුණු කසල විකිණීම ... ... | — |
| (5) ජලසම්පාදනය— | |
| (ඒ) ජල අයබදු 129 (බී) 134 ... ... | — |
| (බී) පෞද්ගලික ජලසම්පාදන ගාස්තු ... ... | — |
| (සී) තහනම් කිරීමේ ගාස්තු ... ... | — |
| (ඩී) පාරිභෝගිකයින් සඳහා කෙරෙන වැඩ ... | — |
| (ඊ) මණින උපකරණ බදු ... ... | — |
| (ඇෆ්) පෞද්ගලික ජලසම්පාදන සම්බන්ධ කිරීම් ... | — |

| ආදායම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. | ශ. |
|---|---|---|
| (6) ආරෝග්‍යශාලා— | | |
| (ඒ) රජයේ ආධාර ... ... ... | 15,528 | 0 |
| (බී) ආරෝග්‍යශාලා බිම් බදු ... ... | — | |
| (7) වෙළඳපොලවල් හා ගාල්— | | |
| (ඒ) බදු ... ... ... | — | |
| (බී) කඩ හා වෙළඳ මැසි ... ... | 6,600 | 0 |
| (සී) පෞද්ගලික වෙළඳ පොලවලට බලපත්‍ර ... | — | |
| (ඩී) බලපත්‍ර 151 (2) ... ... | — | |
| (ඊ) ධාන්‍ය ගබඩා බදු ... ... | — | |
| එකතුව ... | 26,218 | 0 |
| ඊ.—මහජන විනෝදය :— | | |
| (1) කුලී ... ... ... | — | |
| (2) ගවයන් තණ කැවීමේ ගාස්තු ... ... | — | |
| (3) මහජන විනෝද දර්ශන බලපත්‍ර ගාස්තු ... | 300 | 0 |
| (4) විනෝද බදු ... ... ... | 8,000 | 0 |
| එකතුව ... | 8,300 | 0 |
| ඇෆ්.—සොහොන් බිම් (පරිච්ඡේදය 246) :— | | |
| (1) ගාස්තු ... ... ... | — | |
| (2) මිනීරට කුලී ... ... ... | — | |
| (3) ස්මාරක ඉදිකිරීම සඳහා මිනී වලවල් බිම් විකිණීම ... | — | |
| එකතුව ... | — | |
| ජී.—බල්ලන් ලියාපදිංචි කිරීම :— | | |
| (1) ලියාපදිංචි කිරීමේ ගාස්තු ... ... | 25 | 0 |
| (2) දඩ ... ... ... | — | |
| (3) බල්ලන්ගේ කරපටි විකිණීම ... ... | — | |
| (4) බැඳීමේ ගාස්තු ... ... ... | — | |
| එකතුව ... | 25 | 0 |
| එච්.—කිරුම් හා මිණුම් :— | | |
| (1) මුද්දර තැබීමේ ගාස්තු ... ... | — | |
| (2) දඩ ... ... ... | — | |
| එකතුව ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාවීම :— | | |
| (1) ගාස්තු ... ... ... | — | |
| එකතුව ... | — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල :— | | |
| (1) ආධාර ... ... ... | 500 | 0 |
| (2) සම්මාදම් ආධාර ... ... ... | — | |
| එකතුව ... | 500 | 0 |
| මුළු එකතුව ... | 1,23,454 | 0 |

| වියදම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (1) සේවකයින්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 4,519 | 0 |
| (බී) ලිපිකරුවන් ... ... ... | 8,885 | 0 |
| (සී) ආදායම් පරීක්ෂකයින් ... ... | 3,410 | 0 |
| (ඩී) පියන්වරු සහ පණිවුඩ කරුවන් ... ... | 2,412 | 0 |
| (ඊ) කාර්මික උපදේශකවරුන්ගේ ගාස්තු ... | — | |
| (ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... ... | 54 | 0 |
| (ජී) ජීවන හා විශෙෂ ජීවන ආධාර ... ... | 151 | 0 |
| (එච්) නිල ඇඳුම් ... ... ... | 160 | 0 |
| (2) කාර්යාල මණ්ඩලයේ වියදම්— | | |
| (ඒ) ආධාර (එලවුන්සස්) ... ... | 924 | 0 |
| (බී) ගමන් ගාස්තු ... ... ... | 2,000 | 0 |
| (සී) බදු අයකරන්නන් සඳහා කොමිස් ... ... | 1,584 | 0 |
| (ඩී) තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... ... | — | |
| (ඊ) නීතියේ කටයුතු සඳහා ... ... | 500 | 0 |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණය, ප්‍රසිද්ධ කිරීම සහ මුද්දර ... | 3,500 | 0 |
| (ජී) කරත්ත සහ බෝට්ටු තහඩු මිල ... ... | 50 | 0 |
| (එච්) ගණකාධිකාරි ගාස්තු ... ... | 850 | 0 |
| (අයි) නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර ... ... | 800 | 0 |
| (ජේ) හදිසි වියදම් ... ... ... | 350 | 0 |
| (කේ) කාර්යාල ලී බඩු හා උපකරණ ... ... | 3,900 | 0 |
| (ඇම්) අතිකාල දීමනා ... ... | 500 | 0 |
| (3) ආපසු ගෙවීම් ... ... ... | — | |
| (4) ආධාර හා දීමනා ... ... ... | 200 | 0 |
| (5) පාඨශාලා පොත් බෙදදීම ... ... | 1,000 | 0 |
| එකතුව ... | 35,749 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (1) වේතන හා දෛනික දීමනා— | | |
| (ඒ) කර්මාන්ත පරිපාලක වේතන ආධාර ... | — | |
| (බී) ඕවර්සියර්වරුන්ට ... ... | — | |
| (සී) කම්කරුවන්ට ... ... ... | — | |
| (2) නඩත්තු කිරීම ... ... ... | — | |
| (3) යන්ත්‍ර හා ආවුධ ... ... ... | — | |
| (4) වීථි ආලෝක කිරීම ... ... | 5,072 | 0 |
| (5) වැලි ඇතිරීම ... ... ... | — | |
| (6) නිල තහඩු හා අයකිරීම ලේබන ගාස්තු ... | — | |
| (7) අත්පත් කරගැනීම ... ... ... | 300 | 0 |
| (8) සංස්කරණය ... ... ... | — | |
| (9) ණය ගාස්තු ... ... ... | — | |
| (10) සෙවන ගස් ... ... ... | — | |
| (11) මැනීම ... ... ... | 500 | 0 |
| (12) අළුත් වැඩ ... ... ... | 1,600 | 0 |
| (13) ජීවන හා විශෙෂ ජීවන ආධාර ... ... | — | |
| එකතුව ... | 7,472 | 0 |
| සී.—නගර සහා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (1) වේතන ... ... ... | 3,374 | 0 |
| (2) එකතුකරන්නන්ට කොමිස් ... ... | — | |
| (3) කාර්යාලයේ බදු කුලිය ... ... | 1,200 | 0 |
| (4) නඩත්තු කිරීම ... ... ... | — | |
| (5) ලී බඩු ... ... ... | — | |
| (6) ණය ගාස්තු ... ... ... | — | |
| (7) අළුත් කර්මාන්ත ... ... ... | — | |
| (8) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| එකතුව ... | 4,574 | 0 |

| වියදම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. | ශ. |
|---|---|---|
| ඩී.—සනීපාරක්ෂාව :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඒ) වේතන : | | |
| (1) සෞඛ්‍ය පරීක්ෂක ... ... | — | |
| (2) සෞඛ්‍ය සේවිකා ... ... | — | |
| (3) වින්නඹු මාතාවන් ... ... | — | |
| (බී) දෛනික වැටුප් ... ... ... | — | |
| (සී) ආධාර (එලවුන්සස්) ... ... | — | |
| (ඩී) නිල ඇඳුම් ... ... ... | — | |
| (ඊ) මුද්‍රණ ... ... ... | — | |
| (ඇෆ්) විෂ බීජ නාශක ද්‍රව්‍ය ... ... | 200 | 0 |
| (ජී) උපකරණ හා බෙහෙත් (වින්නඹු මාතා) ... | — | |
| (එච්) කාණු ඉදිකිරීම ... ... | 1,250 | 0 |
| (අයි) කාණු ඉදිකිරීම සඳහා වන්දි ... ... | — | |
| (ජේ) සෞඛ්‍ය සතිය සඳහා වියදම් ... ... | 50 | 0 |
| (කේ) කිරි වර්ග කිරීමේ වියදම් ... ... | — | |
| (ඇල්) මහාමාරිය මර්දන ක්‍රමය ... ... | — | |
| (ඇම්) වසූරිය මර්දන ක්‍රමය ... ... | — | |
| (ඇන්) මාතෘ නිවාසය හා දරකාභිවෘධි නිවාස ... | 1,500 | 0 |
| (ඕ) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| (2) කසල ශෝධනය— | | |
| (ඒ) වේතන ... ... ... | 7,985 | 0 |
| (බී) කරත්ත, ගොනුන් හා ලොරි ... ... | — | |
| (සී) ගබඩා ... ... ... | — | |
| (ඩී) කසල පුලුස්සන උඳුන ... ... | — | |
| (ඊ) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| (3) වැසිකිළි පවිත්‍ර කිරීම— | | |
| (ඒ) වේතන ... ... ... | 4,215 | 0 |
| (බී) කරත්ත ගොනුන් හා ලොරි ... ... | — | |
| (සී) ගබඩා ... ... ... | 250 | 0 |
| (ඩී) අසූචි ගබඩා කුලිය ... ... | — | |
| (ඊ) වැසිකිළි නඩත්තු කිරීම ... ... | 250 | 0 |
| (ඇෆ්) අත්පත් කර ගැනීම ... ... | 250 | 0 |
| (ජී) ඉදි කිරීම ... ... ... | 6,250 | 0 |
| (එච්) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| (4) සත්ව ඝාතන ස්ථානය හා ගව මඩුව— | | |
| (ඒ) වේතන ... ... ... | — | |
| (බී) නඩත්තු කිරීම ... ... ... | — | |
| (සී) අත්පත් කර ගැනීම ... ... | 1,500 | 0 |
| (ඩී) ඉදිකිරීම ... ... ... | 1,000 | 0 |
| (ඊ) ගව රෝග ... ... ... | — | |
| (ඇෆ්) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| (5) ජල සම්පාදනය— | | |
| (ඒ) වේතන ... ... ... | — | |
| (බී) උපකරණ ... ... ... | — | |
| (සී) නඩත්තු කිරීම ... ... ... | — | |
| (ඩී) අත්පත්කර ගැනීම ... ... | 200 | 0 |
| (ඊ) ඉදිකිරීම ... ... ... | — | |
| (ඇෆ්) ණය ගාස්තු ... ... ... | — | |
| (ජී) එකතුකරන්නන්ට කොමිස් ... ... | — | |
| (එච්) ප්‍රසිඩ නාන ස්ථාන ... ... | 5,400 | 0 |
| (අයි) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | — | |
| (6) ආරෝග්‍යශාලා— | | |
| (ඒ) වේතන ... ... ... | 11,343 | 0 |
| (බී) නඩත්තු කිරීම ... ... ... | 9,140 | 0 |
| (සී) අසරණයන්ට ... ... ... | — | |
| (ඩී) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| (7) වෙළඳ පොළවල් හා හාල්— | | |
| (ඒ) වේතන ... ... ... | — | |
| (බී) නඩක්තු කිරීම ... ... ... | — | |
| (සී) මුද්‍රණය යනාදිය ... ... | 50 | 0 |
| (ඩී) ඉදිකිරීම ... ... ... | 2,000 | 0 |
| (ඊ) වන්දි ... ... ... | — | |
| (ඇෆ්) සතුකොට ගැනීම ... ... | 1,500 | 0 |
| (ජී) ණය ගාස්තු ... ... ... | — | |
| (එච්) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| එකතුව ... | 54,333 | 0 |

| වියදම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. | ශ. |
|---|---|---|
| ඊ.—මහජන විනෝදය (156) (6) ඒ :— | | |
| (1) වේතන ... ... ... | — | |
| (2) නඩත්තු කිරීම ... ... ... | — | |
| (3) වාදකයින්ට ආධාර (එලවුන්සස්) ... ... | — | |
| (4) සතුකොට ගැනීම ... ... ... | — | |
| (5) ආධාර හා දීමනා ... ... ... | — | |
| (6) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| (7) විනෝද බදු පරීක්ෂණයට ... ... | — | |
| එකතුව ... | — | |
| ඇෆ්.—සොහොන් බිම් :— | | |
| (1) වේතන ... ... ... | — | |
| (2) නඩත්තු කිරීම ... ... ... | — | |
| (3) ඉදිකිරීම ... ... ... | 1,000 | 0 |
| (4) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| එකතුව ... | 1,000 | 0 |
| ජී.—බල්ලන් ලියාපදිංචි කිරීම :— | | |
| (1) බල්ලන් විනාශ කිරීම ... ... | 25 | 0 |
| (2) එකතුකරන්නන්ට කොමිස් ... ... | — | |
| (3) බල්ලන්ගේ කරපටි වලට වියදම් ... ... | — | |
| (4) බල්ලන් බඳින අයගේ ගාස්තු ... ... | — | |
| (5) බලු මඩුව නඩත්තු කිරීම ... ... | — | |
| (6) ඉදිකිරීම ... ... ... | — | |
| එකතුව ... | 25 | 0 |
| එච්.—කිරුම් හා මිනුම් :— | | |
| (1) පරීක්ෂකයින්ට ගාස්තු ... ... | — | |
| (2) උපකරණ ... ... ... | — | |
| එකතුව ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාවීම :— | | |
| (1) ගිනි නාශක බඳුන් වියදම් හා නැවත පිරවීම් ආදියෙහි වියදම් ... ... ... | — | |
| එකතුව ... | — | |
| ජේ.—කියවීම්ශාලා හා පුස්තකාල :— | | |
| (1) වේතන ... ... ... | 600 | 0 |
| (2) දෛනික වැටුප් ... ... ... | — | |
| (3) පොත්පත් හා සඟරා ... ... | 500 | 0 |
| (4) දව භාණ්ඩ ... ... ... | 350 | 0 |
| (5) නඩත්තු කිරීම ... ... ... | 600 | 0 |
| (6) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | — | |
| එකතුව ... | 2,050 | 0 |
| මුළු එකතුව ... | 1,05,203 | 0 |

වර්ෂ 1969 ක්වූ නොවැම්බර් මස 22 වැනි දින පැවැත්වූ විශේෂ සභා රැස්වීමේදී පළාත් පාලන කොමසාරිස්තුමාට සංශෝධනයට ඉඩ ඇතුව සභාව පිළිගනිමින් සම්මත කරන ලදී.

———————,
සුළු නගර සභාවේ සභාපති.

1969 ක්වූ දෙසැම්බර් මස 28 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය.

සංශෝධනය කර අනුමත කරන ලදී.

ජේ. ජී. කීර්තිරත්න,
කෑගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙනුවට.

1970 මාර්තු මස 1 වැනි දින,
කෑගල්ලේ පලාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

## 2 වැනි කොටස—විදුලිය අංශය

| ආදයම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. | ශ. |
|---|---|---|
| (1) විදුලි බලය විකිණීම | 56,416 | 0 |
| (2) මාපක යතුරු බද්ද | 1,479 | 0 |
| (3) වීථි ආලෝක කිරීම | 3,672 | 0 |
| (4) පාරිභෝගිකයන් සඳහා කෙරෙන වැඩ | 5,000 | 0 |
| (5) මිශ්‍ර | 120 | 0 |
| (6) වැඩිමනත් ගෙවීම් ආපසු ලබාගැනීම් | — | |
| (7) ජීවන හා විශෙෂ ජීවන ආධාර | 4,881 | 0 |
| මුළු ආදයම | 71,568 | 0 |

| වියදම් ශීර්ෂය | 1970 ට ගණන් බැලීම රු. | ශ. |
|---|---|---|
| (1) විදුලි බලය උත්පාදනය :— | | |
| (ඒ) දර අඟුරු | — | |
| (බී) තෙල්, කපු රොඩු හා යන්ත්‍ර කාමරයේ ගබඩා | — | |
| (සී) කර්මාන්තයෙහි වේතන කුලී හා ආධාර දීමනා | — | |
| (ඩී) විදුලිය බලය මිලයට ගැනීම | 33,518 | 0 |
| එකතුව | 33,518 | 0 |
| (2) ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම :— | | |
| (ඒ) ගොඩනැගිලි | — | |
| (බී) ඇන්ජින්, බොයිලේරු හා යන්ත්‍ර සූත්‍ර | 4,600 | 0 |
| (සී) මාපක යන්ත්‍ර ඇණ හා අනෙක් උපකරණ | — | |
| (ඩී) විදුලි බලය සැපයීමේ ප්‍රධාන කම්බි නඩත්තු කිරීම | 500 | 0 |
| එකතුව | 5,100 | 0 |
| (3) සේවය හා නිවාසයනට විදුලි කම්බි සම්බන්ධ කිරීම :— | | |
| (ඒ) උපකරණ | 4,000 | 0 |
| (බී) අත්කම් කුලී (තාවකාලික) | 740 | 0 |
| එකතුව | 4,740 | 0 |
| (4) පාලනය හා සාමාන්‍ය වියදම් :— | | |
| (ඒ) පරිපාලක වේතන හා ආධාර | 6,264 | 0 |
| (බී) සංචාරක සේවක වේතන හා ආධාර | 7,394 | 0 |
| (සී) මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය | 500 | 0 |
| (ඩී) නා නා ප්‍රකාර වියදම් | 1,000 | 0 |
| එකතුව | 15,158 | 0 |
| (5) ණය ගාස්තු :— | | |
| (ඒ) පොළිය | 3,510 | 0 |
| (බී) මුල් මුදල ආපසු ගෙවීම | 477 | 0 |
| එකතුව | 3,987 | 0 |
| (6) දීර්ඝ කිරීම හා දියුණු කිරීම | 4,500 | 0 |
| (7) යන්ත්‍රෝපකරණ අගය අඩුවීම් සඳහා තැන්පත් මුදල | 1,000 | 0 |
| (8) ආපසු ගෙවීම | — | |
| (9) මූලික වැය සඳහා සාමාන්‍ය ආදයමෙන් "ඇඩ්වාන්ස්" කරන ලද මුදල් ආපසු ගෙවීම | — | |
| (10) ජීවන හා විශේෂ ජීවන ආධාර | — | |
| මුළු වියදම | 68,003 | 0 |

වර්ෂ 1969 ක්වූ නොවැම්බර් මස 22 වැනි දින පැවැත්වූ විශෙෂ සභා රැස්වීමේදී පළාත් පාලන කොමසාරිස්තුමාට සංශෝධනයට ඉඩ ඇතුව සභාව පිළිගනිමින් සම්මත කරන ලදී.

1969 ක්වූ දෙසැම්බර් මස 28 වැනි දින, සුළු නගර සභා කාර්යාලය.

සුළු නගර සභාවේ සභාපති.

සංශෝධනය කර අනුමත කරන ලදී.

ජේ. ජී. කීර්තිරත්න,
කෑගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා.

1970 මාර්තු මස 1 වැනි දින,
කෑගල්ලේ පලාත් පාළන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

3–222—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## මාවනැල්ල සුළු නගර සභාව

### 1970 අය–වැය ලේඛනය

1969 දෙසැම්බර් මස 26 වෙනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ පළවූ මාවනැල්ල සුළු නගර සභාවේ 1970 අයවැය ලේඛනය තවදුරටත් පහත දැක්වෙන පරිදි සංශෝධනය විය යුතු බැව් මෙයින් දනුම් දෙමි.

### I කොටස—(සාමාන්‍ය)

| වැය ශීර්ෂයෝ | රු. | ශ. |
|---|---|---|
| මුළු එකතුව | 1,73,422 | 0 |

### II කොටස—(විදුලි අංශය)

| අය ශීර්ෂයෝ | යෝජිත අය රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| 1. විදුලි බලය විකිණීම | 1,42,804 | 0 | | |
| 2. මාපක යන්ත්‍ර බද්ද | 2,640 | 0 | | |
| 3. වීථි ආලෝකය | 16,800 | 0 | | |
| 4. පාරිභෝගික කර්මාන්ත | 10,000 | 0 | | |
| 5. මිශ්‍රිත | 1,500 | 0 | | |
| 6. ආපසු ගෙවීම් | 100 | 0 | | |
| 7. ජීවනාධාර සඳහා ආධාර | 13,900 | 0 | | |
| එකතුව | | | 1,87,744 | 0 |

වී. තිලකරත්න,
වැඩ බලන සභාපති, සුළුනගර සභාව,
මාවනැල්ල.

1970 පෙබරවාරි මස 9 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරන ලදී.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්.
කෑගල්ල.

1970 පෙබරවාරි 25 දින,
කෑගල්ලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේදීය.

3–242/1—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## මාවනැල්ල සුළු නගර සභාව

**1 වෙනි අතිරේක අය–වැය ලේඛනය—1970**

| වැය ශීර්ෂය | මුදල රු. | යෝජනා අංකය හා දිනය |
| --- | --- | --- |
| ඊ.—(2) (ජේ) ... | 2,082 ... | 1970.1.21 දින අංක 4(ඒ) දරණ යෝජනාව |

ඊ. ඇල්. ඇම්. යූසුප්,
මාවනැල්ල සුළු නගර සභාවේ සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
මාවනැල්ල.
ජනවාරි 27, 1970.

අනුමත කරමි.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල.

පළාත් පාලන සහකාර කොමසාරිස් කායර්‍ාලය,
කෑගල්ල,
1970.2.25.

3–242/2—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## රක්වාන සුළු නගර සභාව

**අතුරු අයවැය ලේඛණය අංක 3—1969**

I වෙනි කොටස—සාමාන්‍ය

සී. 1 ජී. බෙහෙත් සහ උපකරණ—රු. 3,600.

1969 දෙසැම්බර් මස 26 වෙනි දින පැවැත්වූ සභා රැස්වීමේ අංක 7 (11) දරණ යෝජනාවෙන් සම්මත විය.

වී. ජී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1970 ක්වූ පෙබරවාරි මස 22 වෙනි දින,
රක්වාන සුළු නගර සභා කාර්යාලයේදීය.

3–228—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## වත්තේගම නගර සභාව

මහ නගර සභා ආඥාපනත (252 අධිකාරය) යටතේ සඳහන් 235 (1) දරණ වගන්තිය අනුවත්, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 166 වන වගන්තියෙන් කියවෙන ප්‍රකාරත්, මෙම නගර සභාවේ 1970 වර්ෂය සඳහා වූ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන මෙම කාර්යාලයේදී කාර්යාල වේලාවන් හිදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ධර්මසිරි,
සභාපති.
වත්තේගම නගර සභාව.

1970 ක්වූ පෙබරවාරි මස 25 වෙනි දින,
වත්තේගම නගර සභා කාර්යාලයේදී ය.

3–251—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව

**1970 වර්ෂයට වරිපනම් බදු පොත**

කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාවේ 1970 වර්ෂය සඳහා වූ වරිපනම් බදු පොත් දැනට සූදානම්ව කායර්‍ාලයීය වේලාවන් තුල පරීක්ෂාකර බැලීම සඳහා මෙම සභා කායර්‍ාලයේ විවෘතව ඇති බව, පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ (255 අධිකාරිය) 166 වැනි කොටස සහ නාගරික ආඥාපනතේ (252 අධිකාරිය) 235 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනිල් ඇස්. අබේසුන්දර,
සභාපති.
කඩුගන්නාව, පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කායර්‍ාලය,
කඩුගන්නාව, 1970.2.24.

3–250—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## ලුණුගල සුළු නගර සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

(272 වැනි අධිකාරය වන) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල පරිදි නිසි බලධාරියා වූ ලුණුගල සුළු නගර සභාවේ සභාපති, ජී. ඒ. වෝල්ටර් පෙරේරා වන මා විසින් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනවලදී ලුණුගල සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම් මෙයින් තහනම් කර ඇත.

### උපලේඛනය

1970 මාර්තු 7, 15, 22, 30
1970 අප්‍රේල් 6, 14, 21, 28
1970 මැයි 5, 13, 20, 21, 28
1970 ජූනි 4, 12, 19, 26
1970 ජූලි 3, 11, 18, 25
1970 අගෝස්තු 1, 9, 16, 23, 31
1970 සැප්තැම්බර් 8, 15, 22, 29
1970 ඔක්තෝබර් 7, 14, 22, 29
1970 නොවැම්බර් 6, 13, 21, 28
1970 දෙසැම්බර් 5, 12, 20, 27

ජී. ඒ. වෝල්ටර් පෙරේරා,
සභාපති
සුළු නගර සභාව, ලුණුගල.

1970 පෙබරවාරි මස 27 දින,
ලුණුගල, සුළු නගර සභා කාර්යාලයේදී ය.

3–248—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## වැලිමඩ සුළු නගර සභාව

**(272 වැනි අධිකාරය වන) මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත**

(272 වැනි අධිකාරය වන) මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල අනුව, 1970 වර්ෂය තුළ පහත පළවන උපලේඛනයේ සඳහන් දිනවල, වැලිමඩ සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ විකිණීමාදිය සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

පර්සි සමරවීර,
වැලිමඩ සුළු නගර සභාවේ සභාපති.

1970 පෙබරවාරි මස 22 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්යාලයේදී ය.

### උපලේඛනය

පෙබරවාරි 6, 14, 21, 28
මාර්තු 7, 15, 22, 30
අප්‍රේල් 6, 14, 21, 28
මැයි 1, 5, 13, 20, 21, 28
ජූනි 4, 12, 19, 26
ජූලි 3, 11, 18, 25
අගෝස්තු 1, 9, 16, 23, 31
සැප්තැම්බර් 8, 15, 22, 29
ඔක්තෝබර් 4, 7, 14, 22, 29
නොවැම්බර් 6, 13, 21, 28
දෙසැම්බර් 5, 12, 20, 27.

3–249—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## විශේෂ කොමසාරිස් කායභාලය—දර්ගා නගරය

### 1970 වරිපනම් ලේඛන

1970 වර්ෂය සඳහා මෙම නගරයේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත් එම ලේඛන කායභාල වේලාවන්හිදී මෙම කායභාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය) වූ මහ නගර සභා ආඥපනතේ අංක 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. එම්. අබේසිංහ,
දර්ගා නගරයේ විශේෂ කොමසාරිස්.

1970 පෙබරවාරි 27 වෙනි දින,
දර්ගා නගරයේ විශේෂ කොමසාරිස් කායභාලයේදී ය.

3–247—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## මාවනැල්ල සුළු නගර සභාව

### ගෝ ඝාතක ආඥපනත—272 වැනි අධිකාරය

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින්, මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා, 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන මාවනැල්ල සුළු නගර සභා සීමාවතුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතුව හෝ හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළතදී මා වෙත ලියා දන්වන ලෙස, ගෝ ඝාතක ආඥපනතේ අංක 7 දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| ඒ. සී. ඇම්. ජුනයිදීන් ... ... ... | හරක් මස් ... | මාවනැල්ල නගරයේ අංක 1 දරන හරක් මස් කඩය. |

වී. තිලකරත්න,
මාවනැල්ල සුළු නගර සභාවේ වැඩබලන සභාපති.

1970.2.25 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කායභාලයේ දී ය.

3–227—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## අගලවත්ත සුළු නගර සභාව

### ගෝ ඝාතක ආඥපනත (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි, නියමිත අධිකාරි තැන වූද, අගලවත්ත සුළු නගර සභාවේ සභාපති ඒ. ඩී. මර්වින් සමරනායක වන මම, 1970 වර්ෂයේදී මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනයන්හිදී අගලවත්ත සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

ඒ. ඩී. මර්වින් සමරනායක,
සභාපති,
අගලවත්ත සුළු නගර සභාව.

1970.3.1 වැනි දින,
අගලවත්ත සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1970 | ජනවාරි | 1 | ජාතික වීරයන් සැමරීමේ දිනය. |
| 1970 | ජනවාරි | 14 | තෛපොන්ගල් දිනය. |
| 1970 | ජනවාරි | 22 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | පෙබරවාරි | 4 | නිදහස් උත්සව දිනය. |
| 1970 | පෙබරවාරි | 21 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | මාර්තු | 22 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | අප්‍රේල් | 21 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | මැයි | 20 | වෙසක් පසළොස්වක පෝය දිනය. |
| 1970 | මැයි | 21 | එම අතිරේක දිනය. |
| 1970 | ජූනි | 19 | පොසොන් පසළොස්වක දිනය. |
| 1970 | ජූනි | 20 | එම අතිරේක දිනය. |
| 1970 | ජූලි | 18 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | අගෝස්තු | 16 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | සැප්තැම්බර් | 15 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | සැප්තැම්බර් | 17 | ශ්‍රීමත් අනගාරික ධම්පාල දිනය. |
| 1970 | ඔක්තෝබර් | 4 | සමස්ත ලෝක සත්ව දිනය. |
| 1970 | ඔක්තෝබර් | 14 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | නොවැම්බර් | 13 | පසළොස්වක පෝය දිනය. |
| 1970 | දෙසැම්බර් | 12 | පසළොස්වක පෝය දිනය. |

3–229—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## දෙහිඕවිට උප නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

(272 වැනි අධිකාරය වන) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපනතේ 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියා වන දෙහිඕවිට උප නගර සභාවේ සභාපති ඇම්. ඇල්. ඒ. ජාපීර් වන මා විසින් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනවලදී දෙහිඕවිට උප නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළෙඳාම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

1970 පෙබරවාරි 4, 6, 14, 21, 28.
1970 මාර්තු 7, 15, 22, 30.
1970 අප්‍රේල් 6, 14, 21, 28.
1970 මැයි 5, 13, 20, 28.
1970 ජූනි 4, 12, 19, 26.
1970 ජූලි 3, 11, 18, 25.
1970 අගෝස්තු 1, 9, 16, 23, 31.
1970 සැප්තැම්බර් 8, 15, 22, 29.
1970 ඔක්තෝබර් 4, 7, 14, 22, 29.
1970 නොවැම්බර් 6, 13, 21, 28.
1970 දෙසැම්බර් 5, 12, 20, 27.

ඇම්. ඇල්. ඒ. ජාපීර්,
සභාපති,
දෙහිඕවිට උප නගර සභාව.

1970 පෙබරවාරි මස 25 වැනි දින,
දෙහිඕවිට උප නගර සභා කාර්යාලයේ දීය.

3–216—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛන

1970 වර්ෂය සඳහා වූ පැල්මඩුල්ල සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥපනතේ 235 (1) දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

එච්. ඇල්. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

1970 පෙබරවාරි මස 26 වැනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේ දීය.

3–217—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

### ගෝඝාතක ආඥපනත (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (ගෝඝාතක) ආඥපනතේ (272 වන අධිකාරයේ) (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරී තැනවූ ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ ගම්සභාවේ සභාපති වූ ද, තුල්සන් තුසිත ලවන් දිසානායක වන මම, 1970 වර්ෂයේදී මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනයන්හිදී වැඋඩ ගම්සභාව සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

| මාසය | | පෝය දින | | සිකුරාද දින |
|---|---|---|---|---|
| මාර්තු | ... | 7, 15, 22, 30 | ... | 6, 13 ,20, 27 |
| අප්‍රේල් | ... | 6, 14, 21, 28 | ... | 3, 10, 17, 24 |
| මැයි | ... | 5, 13, 20, 21, 28 | ... | 1, 8, 15, 22, 29 |
| ජූනි | ... | 4, 12, 19, 26 | ... | 5, 12, 19, 26 |
| ජූලි | ... | 3, 11, 18, 25 | ... | 3, 10, 17, 24, 31 |
| අගෝස්තු | ... | 1, 9, 16, 23, 31 | ... | 7, 14, 21, 28 |
| සැප්තැම්බර් | ... | 8, 15, 22, 29 | ... | 4, 11, 18, 25 |
| ඔක්තෝබර් | ... | 7, 14, 22, 29 | ... | 2, 9, 16, 23, 30 |
| ඔක්තෝබර් 4 දින ලෝක සත්ව දිනය | | | | |
| නොවැම්බර් | ... | 6, 13, 21, 28 | ... | 6, 13, 20, 27 |
| දෙසැම්බර් | ... | 5, 12, 20, 27 | ... | 4, 11, 18, 25 |

ඩී. ඇම්. ටී. ටී. ඇල්. දිසානායක,
සභාපති,
වැඋඩ ගම්සභාව.

1970 මාර්තු මස 2 වෙනි දින,
වැඋඩ ගම්සභා කාර්යාලයේදී ය.

3–224—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම්සභාව

### ගෝඝාතක ආඥපණත

මෙහි පහත උපලේඛණයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි මස් වෙළඳාම කිරීමෙන් ගෝඝාතක ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්වා අයදුම්පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතක ආඥ පණතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන කටාන ගම්සභා ප්‍රදේශ සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමණ හේතූන් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

ඇම්. ඇස්. අයිවන් ද සිල්වා,
සභාපති,
කටාන ගම්සභාව.

කටාන ගම්සභා කාර්යාලය,
කටාන, 2.3.1970.

### උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | | ස්ථානය | | ව්‍යාපාරයේ නම |
|---|---|---|---|---|
| කාදර් සින්කන්දර් මොහමඩ්, අංක 64, තකියා පාර, පෝරුතොට,, කොච්චිකඩේ. | ... | කොච්චිකඩේ–මඩම්පැල්ල පාරේ මානවේරිය පාලමඅසල ඇති කඩ කාමරය. | ... | එළු මස් සහ හරක් මස්. |

8–232—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## පුත්තලම් පත්තු ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අය විසින් 1970 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර නිකුත් කිරීම ගැන පුත්තලම් පත්තු ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දන්වීම ගැසට් පත්‍රයෙ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි පරිච්ඡේදයේ) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | | වෙළඳාම | | පිහිටි ස්ථානය |
|---|---|---|---|---|---|
| 1. | එම්. සේගුවරිසයි, මුට්ටිපාලයිකුලම්, මදුරන්කුලිය. | ... | හරක් හා එළු මස් | ... | මදුරන්කුලිය |
| 2. | පී. ඩී. ජී. අප්පුහාමි, මුන්දලම | ... ... ... | හරක් මස් | ... | මුන්දලම |
| 3. | ඇම්. ජේ. ඒ. ජබාරි, පෝල්ස් වීදිය, පුත්තලම | ... ... ... | හරක් මස් | ... | පාලාවිය |
| 4. | ඇන්. ඒ. හමීදු, පෝල්ස් වීදිය, පුත්තලම | ... ... ... | හරක් මස් | ... | සිරාම්බියඩිය 3නේ කණුව |

ඩබ්ලිව්. පී. කැණිසියස් පීරිස්,
පුත්තලම් පත්තු ගම්සභාපති.

1970 පෙබරවාරි 25 වැනි දින,
මදුරන්කුලියේ දී ය.

3–239—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. ජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු .. | 70 3. 5 බ්‍රහස්පතින්ද ... | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 3.13 සිකුරාද ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද .. | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් .. | 70. 4. 3 සිකුරාද ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද ... | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද ... | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද ... | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි .. | 70. 6. 5 සිකුරාද ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

1970 මාර්තු 5 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.